සියලු ම හිමිකම් ඇවිරිණි/அனைத்து உரிமைகளும்/All Right Reserved

WWW.QUESTIONBANK.LK

# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය

**ගිණුම්කරණය** | 33 S I | **පැය දෙකයි**

**උපදෙස්:**
* සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා **එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**
* අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු **අදාළ තිත් ඉරි මත ලියන්න.**
* සෑම ප්‍රශ්නයකටම **සමාන** ලකුණු හිමි වේ.
* විභාග අංකය ඉහලින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.
* **වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.**

විභාග අංකය :.............................................................

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| | අත්සන | සංකේත අංක |
|---|---|---|
| 1 වන පරීක්ෂකගේ | | |
| 2 වන පරීක්ෂකගේ | | |
| අති ප්‍රධාන පරීක්ෂකගේ | | |
| ගණිත පරීක්ෂකගේ | | |
| ප්‍රධාන පරීක්ෂකගේ | | |

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංකය | ලකුණු |
| 1 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

(1) ගිණුම්කරණයේ මූලික අරමුණු වන්නේ,

1) ආයතනයක සියලුම ගනුදෙනු ගිණුම් පොත්වල සටහන් කිරීමය.
2) ආයතනයක ගනුදෙනු සටහන් කිරීම, වර්ග කිරීම සහ සාරාංශ කිරීම ය.
3) ආයතනයක මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති තොරතුරු විශ්ලේෂණය කිරීමයි.
4) ආයතනයක ගනුදෙනුවල සවිස්තරාත්මක විශ්ලේෂණයක් එහි කළමනාකරුවන්ට සැපයීමය.
5) ආයතනයක් පිළිබඳ තොරතුරු, එහි තොරතුරු භාවිතා කරන පාර්ශවයන්ට ආර්ථික තීරණ ගැනීම සඳහා සැපයීමය.

(2) ව්‍යාපාරයක තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | 2023.03.31 | 2024.03.31 |
|---|---|---|
| වත්කම් | 869,000 | 1,050,000 |
| වගකීම් | 59,000 | 150,000 |
| වර්ෂය තුල ගැනිලි | 10,000 | 18,000 |
| වර්ෂය තුල අමතර ප්‍රා. | 3,000 | 5,000 |

2024.03.31 අවසන් වර්ෂය සඳහා ලාභය/අලාභය වන්නේ,

1) අලාභය රු. 103,000 2) ලාභය රු. 77,000 3) ලාභය රු. 103,000
4) ලාභය රු. 110,000 5) ලාභය රු. 96,000

(3) 2024.04.01 දින අනුර තම ව්‍යාපාරයේ කටයුතු සඳහා ඔහු සතු රු. 3,500,000 ක ලොරි රථය යොදවන ලදී. එදින රු. 800,000 ක තොග ණයට විකුණූ අතර රු. 60,000 ක භාණ්ඩ ඇණවුමට අනුකූල නොවූ නිසා හරවා එවා ඇත. මෙම ගණුදෙනු සටහන් කිරීමට භාවිතා කරන මූලාශ්‍ර ලියවිලි අනුපිළිවෙලින්

1) විකුණුම් ඉන්වොයිසිය, බැරපත, ලදුපත
2) ලදුපත, ජ'නල් වවුචරය, ගැණුම් ඉන්වොයිසිය
3) ජ'නල් වවුචරය, විකුණුම් ඉන්වොයිසිය, හරපත
4) ජ'නල් වවුචරය, විකුණුම් ඉන්වොයිසිය, බැරපත
5) ලදුපත, විකුණුම් ඉන්වොයිසිය, බැරපත

(4) අරලිය ව්‍යාපාරය විසින් කාර්යාලය පවත්වාගෙන යාම සඳහා රු. 10,000 ක මාසික කුලියට ගොඩනැගිල්ලක් ලබාගෙන ඇත. ආරම්භයේදී රු. 50,000 ක නැවත ලබාගත හැකි ආරක්ෂිත තැන්පතුවක් ගෙවා ඇත. ගොඩනැගිල්ලේ වෙළඳපල වටිනාකම රු. 1,000,000 කි. ඉහත සඳහන් කළ කරුණු වලට අනුව පලමු මාසය අවසානයේ ගිණුම්කරණ සමීකරණය කෙරෙහි බලපෑම වන්නේ,

| | ප්‍රාග්ධනය රු. | + | වගකීම් රු. | = | වත්කම් රු. |
|---|---|---|---|---|---|
| 1) | 40,000 | + | 10,000 | = | 50,000 |
| 2) | (10,000) | + | - | = | (10,000) |
| 3) | (50,000) | + | 1,000,000 | = | 950,000 |
| 4) | (50,000) | + | | = | 50,000 |
| 5) | ඉහත කිසිවක් නොවේ. | | | | |

(5) තනි පුද්ගල ව්‍යාපාරයක පහත සඳහන් තොරතුරු ඔබට සපයා ඇත.

| | |
|---|---|
| 2024.03.31 දිනට ප්‍රාග්ධන ගිණුමේ ශේෂය | රු. 1,253,000 |
| 2023.04.01 දිනට ප්‍රාග්ධන ගිණුමේ ශේෂය | රු. 1,069,000 |
| වර්ෂය තුළ දී යොදා ඇති අමතර ප්‍රාග්ධනය | රු. 20,000 |
| අයිතිකරුගේ ගැනිලි - මුදල් | රු. 49,000 |
| - භාණ්ඩ | රු. 69,000 |

ඉහත කී භාණ්ඩ දක්වා ඇත්තේ ඉන්වොයිසියේ සඳහන් මිලටය. එම ඉන්වොයිස් වටිනාකම ගණනය කර ඇත්තේ පිරිවැයට 20% ක ලාභයක් (Mark-up) සහ 15% එකතු කල අගය මත බදු ඇතුලත් කිරීමෙන් පසුවය. ව්‍යාපාරයේ 2023/24 වර්ෂය සඳහා ලාභය විය යුත්තේ,

1) රු. 118,000 2) රු. 246,000 3) රු. 263,000
4) රු. 282,000 5) රු. 273,000

(6) පහත තොරතුරු තොග වෙළෙඳසැලක 2024.03.31 දිනෙන් අවසන් වර්ෂයට අදාල වේ.

| | **රු. 000** |
|---|---|
| ආරම්භක තොගය | 4,800 |
| අවසාන තොගය | 3,100 |
| හානිවූ තොගය | 1,600 |
| ගැණුම් | 59,500 |

මෙම තොරතුරු පදනම්කරගත් දළ ලාභය රු. 6,720,000 කි. මෙම ගණනයේදී අවසාන තොගය රු. 112,000 කින් අධි ගණනය වී ඇති අතර ආරම්භක තොගය රු. 256,000 කින් අවතක්සේරු වී ඇත. 2024.03.31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදයේ නිවැරදි දළ ලාභය වන්නේ,

1) රු. 6,352,000 2) රු. 6,576,000 3) රු 7,088,000
4) රු. 6,208,000 5) රු. 6,325,000

(7) ව්‍යාපාරයක පිලියෙල කරන ලද ශේෂ පිරික්සුමකින් අනාවරණය නොවන වැරදි කාණ්ඩය නිවැරදිව දැක්වනුයේ,

1) ඌණතා දොෂ, හිලව් දෝෂ, ද්වි සටහන් දොෂ
2) මූලධර්ම දෝෂ, ද්විසටහන් දෝෂ, හිලව් දෝෂ
3) අතිරික්තතා දෝෂ, ඌණතා දෝෂ, ද්විසටහන් දෝෂ
4) හිලව් දෝෂ, අතිරික්තතා දෝෂ, මූලධර්ම දෝෂ
5) මූලධර්ම දෝෂ, ද්විසටහන් දෝෂ, ඌණතා දෝෂ

(8) සමාගමක 2024 මාර්තු මාසයට අදාළ තොරතුරු පහත දැක්වේ.

| දිනය | විස්තරය | ඒකක | ඒකක පිරිවැය |
|---|---|---|---|
| 2024.03.01 | තොගය | 3,000 | 10 |
| 2024.03.05 | ගැනුම් | 1,000 | 12 |
| 2024.03.15 | ගැනුම් | 2,000 | 15 |
| 2024.03.16 | ආපසු යැවුම් (2024.03.15 මිලදීගත් භාණ්ඩ වලින්) | 200 | ? |

2024 මාර්තු 20 වන දින භාණ්ඩ ඒකක 3,500 ක් විකුණා ඇති අතර සමාගම තොග නිකුත් කිරීම මිල කිරීමේදී පෙර ඇතුළු පෙර පිට (FIFO) ක්‍රමය භාවිතා කරයි.

2024.03.31 දිනට තොගයේ වටිනාකම කීයද?

1) රු. 27,000 කි 2) රු. 30,000 කි 3) රු. 33,000 කි
4) රු. 36,000 කි 5) රු. 38,000 කි

**පහත තොරතුරු යොදා ගනිමින් පහත ප්‍රශ්න ත්‍රිත්වය සඳහා පිළිතුරු සපයන්න.**

**ජංගම ගිණුම**

| | X | Y | Z | | X | Y | Z |
|---|---|---|---|---|---|---|---|
| 2023.04.01 ඉ/ගෙ | | 30,000 | | 2023.04.01 ඉ/ගෙ | 60,000 | | |
| මුදල් ගැනිලි | 80,000 | | | ණය පොලී | 12,000 | 10,000 | |
| භාණ්ඩ ගැනිලි | | 50,000 | | ප්‍රාග්ධන පොලී | 120,000 | 80,000 | 30,000 |
| ගැනිලි පොලී | 4,000 | 2,500 | | ලාභ කොටස් | 80,000 | 80,000 | 20,000 |
| ප්‍රාග්ධන ගිණුම | | 150,000 | | හවුල් වේතන | 48,000 | 48,000 | 24,000 |
| ප/ගෙ | 486,000 | | 74,000 | ප්‍රාග්ධන ගිණුම | 250,000 | | |
| | | | | ප/ගෙ ශේෂය | | 145,000 | |
| | 570,000 | 232,500 | 74,000 | | 570,000 | 232,500 | 74,000 |

**ප්‍රාග්ධන ගිණුම**

| | X | Y | Z | | X | Y | Z |
|---|---|---|---|---|---|---|---|
| කීර්ති නාමය | | | 100,000 | 2023.04.01 ඉ/ගෙ | 1,200,000 | 800,000 | |
| ජංගම ගිණුම | 250,000 | | | මුදල් | | | 600,000 |
| ප/ගෙ/ශේ | 1,000,000 | 1,000,000 | 500,000 | කීර්තිනාමය | 50,000 | 50,000 | |
| | | | | ජංගම ගිණුම | | 150,000 | |
| | 1,250,000 | 1,000,000 | 600,000 | | 1,250,000 | 1,000,000 | 600,000 |

(9) 2024.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරය ඉපයූ ලාභය කොපමණද?

1) රු. 530,000 2) රු. 180,000 3) රු. 523,500

4) රු. 280,000 5) ඉහත කිසිවක් නොවේ.

(10) ප්‍රාග්ධන පොලී වර්ෂයකට 10% කි. හවුල් වේතන මසකට රු. 4,000 කි. හවුල් ගිවිසුමේ අවම වාර්ෂික ආදායමක් Z ට සහතික වී ඇත්නම් එය ලාභාලාභ විසර්ජනයේදී ගලපා ඇතන්ම් Z ට සහතික වී ඇති අවම වාර්ෂික ආදායම කොපමණද?

1) රු. 74,000 2) රු. 148,000 3) රු. 50,000
4) රු. 84,000 5) ඉහත කිසිවක් නොවේ.

(11) X සහ Y ලාභාලාභ බෙදා ගනු ලැබුවේ සම සමව වන අතර Z ලාභයෙන් 1/5 ක් ලැබීමට එකගව හවුලට සම්බන්ධ විය. මෙම තත්ත්වය යටතේ හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,

1) හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 50,000 කට තක්සේරු කර ඇත.
2) හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 100,000 කට තක්සේරු කර ඇත.
3) හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 500,000 ක් ලෙස තක්සේරු කර ඇත.
4) හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 100,000 කින් වැඩිවී ඇත.
5) හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 100,000 කින් පහත වැටී ඇත.

(12) ආයතනයක 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු ලබා දී ඇත.

| | | |
|---|---|---|
| අමුද්‍රව්‍ය තොග | 2023.04.01 දිනට | 25,000 |
| | 2024.03.31 දිනට | 20,000 |
| අමුද්‍රව්‍ය මිලට ගැනීම් | | 80,000 |
| පරිවර්ථන පිරිවැය | | 120,000 |
| ඍජු ශ්‍රම පිරිවැය | | 40,000 |
| පොදු කාර්ය පිරිවැය - නිෂ්පාදන | | 90,000 |
| නිෂ්පාදන නොවන | | 45,000 |
| 2023.04.01 සිට 2024.03.31 දක්වා නොනිමි තොගයේ වැඩිවීම | | 30,000 |

2024.03.31 න් අවසන් වර්ෂය සඳහා මුළු නිෂ්පාදන පිරිවැය කොපමණද?

1) රු. 205,000 2) රු. 175,000 3) රු. 185,000
4) රු. 235,000 5) රු. 240,000

**පහත ප්‍රශ්න ද්විත්වය සඳහා මෙම තොරතුරු භාවිතා කරන්න.**

2024 මාර්තු 31 දිනට QB සමාගමේ අවසාන භෞතික තොගයේ පිරිවැය රු. 1,060,000 කි. පිරිවැය රු. 250,000 ක් වූ හානි වූ තොගයක් ඉහත තොගයේ ඇතුළත්ව ඇත. නමුත් මෙම තොගය විවෘත වෙළඳ පොලේ රු. 150,000 කට විකිණීමට අපේක්ෂා කෙරේ. 2024 මාර්තු 31 දිනට ව්‍යාපාරයේ තොගය භෞතිකව ගණනය කල අතර විකිණීමේ හෝ ආපසු එවීමේ පදනමට යවා ඇති එහෙත් ශේෂ පත්‍ර දිනට ආපසු එවීමේ දින ඉකුත් නොවූ බෙදාහරින්නන් වෙත යවා ඇති භාණ්ඩ විකුණුම් මිලට රු. 330,000 කි. මෙම භාණ්ඩ පිරිවැයට 10% ක ආන්තිකයක් එකතු කර ඉන්වොයිස් කර ඇත.

(13) මෙම ව්‍යාපාරයේ අවසාන තොගයේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය වන්නේ,

1) රු. 1,010,000 හා රු. 800,000

2) රු. 860,000 හා රු. 950,000
3) රු. 1,360,000 හා රු. 1,260,000
4) රු. 860,000 හා රු. 800,000
5) ඉහත කිසිවක් නොවේ.

(14) ඉහත සමාගම තොග හඳුනාගැනීමේ දී පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගය මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සටහන් කිරීමට අදාල ගිණුම්කරණ සංකල්පය වන්නේ,

1) මූල්‍ය මිණුම් සංකල්පය 2) ආරක්ෂණ සංකල්පය 3) උපචිත සංකල්පය
4) උපලබ්ධි සංකල්පය 5) සංගතතා සංකල්පය

(15) තොග පිරිවැය නිශ්චිතව හඳුනාගැනීම කළ නොහැකි විට පිරිවැය සූත්‍ර තොග ආගණනය සඳහා යොදා ගනු ලැබේ. එම පිරිවැය සූත්‍ර අතරින් සාපේක්ෂව ඉහල දල ලාභයක් ලැබෙන පිරිවැය සූත්‍රය වන්නේ,

1) පෙර ඇතුළු පෙර පිට (FIFO), පසු ඇතුළු පෙර පිට (LIFO) සහ බරිත සාමන්‍යය (WAC)
2) පසු ඇතුළු පෙර පිට (LIFO) සහ බරිත සාමාන්‍යය (WAC)
3) පෙර ඇතුළු පෙර පිට (FIFO) කාර්ය පිරිවැයකරණය සහ හරිත සාමන්‍යය (WAC)
4) පෙර ඇතුළු පෙර පිට (FIFO)
5) පෙර ඇතුළු පෙර පිට (FIFO) සහ බරිත සාමන්‍යය (WAC)

(16) වැඩි දියුණු කිරීමේ ගුණාත්මක ලක්ෂණ පමණක් ඇතුළත් නිවැරදි වර්ගීකරණය වන්නේ,

1) අවබෝධකරගත හැකි බව, සත්‍යාපනය කළ හැකි බව, අදාළ බව, සැසඳිය හැකි බව
2) අවබෝධකරගත හැකි බව, සරල බව, සංගතතාවය, සැසඳිය හැකි බව
3) අවබෝධකරගත හැකි බව, සත්‍යාපනය කළ හැකි බව, සැසඳිය හැකි බව, කාලීන බව
4) අවබෝධකරගත හැකි බව, නිවැරදි බව, විශ්වාසනීය නියෝජනය, කාලීන බව
5) අවබෝධකරගත හැකි බව, අදාළ බව, සංගතතාවය, සැසඳිය හැකි බව

(17) සීමිත අශෝක පොදු සමාගමේ 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගණනය කරන ලද මුළු විස්තීර්ණ ආදායම සහ කාලච්ඡේදය සඳහා ලාභය පිළිවෙලින් රු. 600,000 සහ රු. 700,000 ක් විය. නමුත් එය ගණනය කිරීමේදී පහත වැරදි සිදු වී ඇති බව පසුව අනාවරණය විය.

- අවසාන තොගය ගණනය කිරීමේ දී පිරිවැය රු. 20,000 ක් වූ තොගයක් මගහැරී තිබුණි.
- රු. 40,000 ක පොලී ආදායම, පොලී වියදමක් ලෙස සටහන් කර ඇත.
- ප්‍රථම වර ඉඩම් ප්‍රත්‍යාගණනයේදී හටගත් රු. 100,000 ක ප්‍රත්‍යාගණන අලාභය සටහන් කර නොමැත.
- පෙර වර්ෂයේ කපාහළ රු. 30,000 ක බොල්ණය නැවත ලැබීම ණයගැති පාලන ගිණුමට බැර කර මුදල් ගිණුමට හර කර ඇත.

ඉහත වැරදි නිවැරදි කිරීමෙන් පසු නිවැරදි මුළු විස්තීර්ණ ආදායම සහ කාලච්ඡේදය සඳහා ලාභය වන්නේ,

| | මුළු විස්තීර්ණ ආදායම | **කාලච්ඡේදය සඳහා ලාභය** |
|---|---|---|
| 1) | රු. 600,000 | රු. 610,000 |
| 2) | රු. 630,000 | රු. 630,000 |
| 3) | රු. 630,000 | රු. 640,000 |
| 4) | රු. 640,000 | රු. 600,000 |
| 5) | රු. 590,000 | රු. 630,000 |

(18) මූල්‍ය ගිණුම්කරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව පහත කුමන දෑ වත්කමක ලක්ෂණ වන්නේ ද?

A. එය ආයතනයක් විසින් පාලනය කල හැකි සම්පතකි.
B. එය තුලින් අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒම අපේක්ෂා කරයි.
C. එහි පිරිවැය හෝ අගය විශ්වාසනීය ලෙස මැනිය හැකි වේ.

1) B පමණි 2) A හා B පමණි 3) A හා C පමණි
4) B හා C පමණි 5) A, B හා C යන සියල්ලම

**පහත සඳහන් ප්‍රශ්න දෙක සඳහා පිළිතුරු ලිවීමට පහත තොරතුරු පදනම් කර ගන්න.**

Enrich සංගමයේ 2024.03.31 න් අවසන් වසරට පහත තොරතුරු අදාල වේ.

| | **රු. 000** |
|---|---|
| සාමාජික මුදල් ලැබීම | 540 |
| යාවජීව සාමාජික මුදල් ලැබීම | 120 |
| මුලු වියදම් | 600 |
| සාමාන්‍ය පරිත්‍යාග | 20 |

**අතිරේක තොරතුරු,**

- යාවජීව සාමාජික මුදල් ලැබුණු වර්ෂයේ සිට ඉදිරි වර්ෂ 4 කදී ආදායම ලෙස හඳුනා ගත යුතුය.
- ලැබුනු සාමාජික මුදල් තුල 2024.04.01 න් ආරම්භ වන වසරට ලද රු. 40,000 ක් ද, ඇතුළත් වේ. 2023.04.01 දිනට ලැබිය යුතු සාමාජික මුදල් රු. 30,000 කි. සාමාජික මුදල් උපචිත පදනමට ගිණුම්ගත කරයි.
- 2024.01.01 දිනට මිලට ගත් රු. 150,000 ක ඡායා පිටපත් යන්ත්‍රයක් ඉහත වියදම් තුල ඇතුලත් කර ඇත. ඡායා පිටපත් යන්ත්‍රයේ වාර්ෂික ක්ෂය රු. 40,000 ක් වේ. ක්ෂය ගිණුම්ගත කර නැත.

(19) 2024.03.31 න් අවසන් වසර සඳහා අතිරික්තය/ඌණතාවය කොපමණද?

1) රු. 120,000 ක අතිරික්තයක් 2) රු. 60,000 ක අතිරික්තයක් 3) රු. 30,000 ක අතිරික්තයක්
4) රු. 20,000 ක ඌණතාවයක් 5) රු. 60,000 ක ඌණතාවයක්

(20) 2024.03.31 න් අවසන් වසර සඳහා ආදායම් හා වියදම් ගිණුමට සටහන් කරන මුලු සාමාජික මුදල් හා මුලු වියදම් කොපමණද?

| | සාමාජික මුදල (රු) | මුලු වියදම්(රු) |
|---|---|---|
| 1) | 500,000 | 600,000 |
| 2) | 660,000 | 460,000 |
| 3) | 500,000 | 460,000 |
| 4) | 530,000 | 460,000 |
| 5) | 540,000 | 450,000 |

**පහත කරුණු ඇසුරෙන් පහත ප්‍රශ්න තුන සඳහා පිළිතුරු සපයන්න.**

සීමිත Myenrich.lk සමාගමේ 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ බදු පසු ශුද්ධ ලාභය රු. 400,000 කි. සමාගම පසුගිය වර්ෂ තුන තුළ අඛණ්ඩව අලාභ ලැබීය. එම නිසා එම වර්ෂ තුන තුළදී ලාභාංශ කිසිවක් ගෙවා නැත. තවද එම වර්ෂ තුන තුළදී නව කොටස් නිකුත් කිරීම් සිදු කර නොමැත. 2023.04.01 දිනට කොටස් ප්‍රාග්ධනය හා සංචිත ශේෂ පහත දැක්වේ.

රු. 10 සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය    රු. 500,000
රඳවාගත් ඉපැයුම් ගිණුමේ හර ශේෂය    රු. 100,000

(21) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාමාන්‍ය කොටස් හිමියන් සඳහා 15% අවසන් ලාභාංශයක් 2024 මාර්තු 31 දින යෝජනා කරන ලදී. මෙම යෝජිත ලාභාංශ මූල්‍ය වාර්තාවල ඉදිරිපත් කළ යුත්තේ කෙසේද?

1) ගෙවිය යුතු ලාභාංශ රු. 45,000 ලෙසය
2) ගෙවිය යුතු ලාභාංශ රු. 135,000 ලෙසය
3) මූල්‍ය ප්‍රකාශවල සටහනක් ලෙස පමණක් හෙළිදරව් කළ යුතුය.
4) හිමිකමේ කොටසක් ලෙස ඇතුළත් කළ යුතුය
5) විසර්ජන ලෙස ලාභ ලාභ ගිණුමට අයකළ යුතුය.

(22) 2024 මාර්තු 31 දින ට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනෝ දැක්වෙන රඳවාගත් ඉපැයුම් ගිණුමේ ශේෂය වනුයේ,

1) රු. 240,000    2) රු. 340,000    3) රු. 300,000
4) රු. 380,000    5) රු. 190,000

(23) සීමිත අමර පොදු සමාගමේ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයෙන් උපුටාගත් තොරතුරු පහත දැක්වේ.

| | **2023.04.01 (රු. 000)** | **2024.03.31 (රු. 000)** |
|---|---|---|
| රඳවාගත් ලාභ | 200 | 300 |
| පොදු සංචිත | 100 | 150 |
| ප්‍රත්‍යාගණන සංචිත | 75 | 125 |

2023/2024 වර්ෂය සඳහා ගෙවූ ලාභාංශ රු. 80,000 කි. දී ඇති තොරතුරු මත 2024.03.31 න් අවසන් වර්ෂයේ කාලච්ඡේදය සඳහා ලාභය වන්නේ,

1) රු. 230,000    2) රු. 340,000    3) රු. 300,000
4) රු. 380,000    5) රු. 190,000

(24) සීමිත මහේෂ් පොදු සමාගමේ 2024.03.31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂවරු 2024.06.15 දින අනුමත කරන ලදී. 2024.03.31 දින සිට 2024.06.15 දින දක්වා පහත සිදුවීම් සමාගමේ සිදුවිය.

A. 2024.05.25 දින ගබඩාවේ ඇති වූ ගින්නකින් ගබඩා ගොඩනැගිල්ලට රු. 800,000 ක අලාභයක් සිදුවීම.
B. 2024.04.20 දින සිදු කල ණයට විකුණුම් නිසා ඇති වූ රු. 200,000 ක ණයගැතියෙකු 2024.06.10 දින බුන්වත් වීය.
C. 2024.06.01. දින සාමාන්‍ය කොටස් හිමියන්ට රු. 200,000 ක අවසාන ලාභාංශයක් යෝජනා කිරීම.
D. 2024.03.31 දිනට පිරිවැය රු. 500,000 ක් වූ තොගයක් 2023.05.25 දින රු. 450,000 කට විකිණීම.

LKAS 10 (වාර්තාකරණ කාලච්ඡේදයට පසු සිදුවීම්) ප්‍රමිතියට අනුව 2024.03.31 න් අවසන් වසර සඳහා කුමන සිදුවීම් නොගලපන සිදුවීම් ලෙස සැලකේ ද?

1) A හා B පමණි    2) A,B හා D පමණි    3) D පමණි
4) A,B හා C පමණි    5) C පමණි

(25) කළමනාකරණ ගිණුම්කරණ සම්බන්ධයෙන් පහත දී ඇති කුමන ප්‍රකාශය /ප්‍රකාශ නිවැරදි වේද?

A. එය ආයතනයක කළමනාකරණ තොරතුරු පද්ධතියෙහි කොටසකි.

B. එය සංවිධානයක මෙහෙයුම් කටයුතු සැලසුම් කිරීමට හා පාලනයට යොදා ගනී.

C. එය බාහිර පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු සම්පාදනය කරයි.

1) A පමණි.
2) B පමණි.
3) C පමණි.
4) A සහ B පමණි.
5) A, B සහ C සියල්ලම

(26) පහත තොරතුරු සමාගමක 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ වේ.

| | රු. ‘000 |
|---|---|
| විකුණුම් | 900 |
| විකුණුම් පිරිවැය | 600 |
| 2023.04.01 දිනට තොගය | 125 |
| 2024.03.31 දිනට තොගය | 175 |

වර්ෂයක් සඳහා වැඩ කරන දින 360 ක් බව උපකල්පනය කරන්න.

2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ තොග රඳවුම් කාලය,

1) දින 60
2) දින 70
3) දින 75
4) දින 90
5) දින 150

(27) දළ ලාභ අනුපාතය වෙනස්වීමට බලපාන හේතු ඇතුළත් නිවැරදි කාණ්ඩය කුමක්ද?

1) විකුණුම් මිල, භාණ්ඩවල පිරිවැය, විකුණුම් මිශ්‍රය, වැරදි තොග තක්සේරුව
2) විකුණුම් මිල, භාණ්ඩවල පිරිවැය, මෙහෙයුම් වියදම්, වැරදි තොග තක්සේරුව
3) විකුණුම් මිල, භාණ්ඩවල පිරිවැය, වැරදි තොග තක්සේරුව, වෙළඳ මට්ටම
4) විකුණුම් මිල, භාණ්ඩවල පිරිවැය, වැරදි තොග තක්සේරුව, තොග විනාශ වීම
5) විකුණුම් මිල, භාණ්ඩවල පිරිවැය, විකුණුම් මිශ්‍රය, ශුද්ධ උපලබ්ධි අගය

(28) ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දී ඇත.

A - ජංගම වගකීම්/ මුළු ණය
B - මුළු ණය/ හිමිකම්
C - දිගුකාලීන ණය/ මුළු වත්කම්
D - ජංගම වත්කම් / ජංගම වගකීම්

සමාගමක තෝලනය මැනීමේදී ඉහත අනුපාතවලින් කුමක් භාවිතා කරයිද?

1) A සහ D පමණි.
2) A, B සහ C පමණි.
3) A, C සහ D පමණි.
4) B සහ C පමණි.
5) B, C සහ D පමණි.

(29) අනෙකුත් සාධක ස්ථාවරව පවතින විට සමච්ඡේදන ලක්ෂ්‍යය (BEP) සම්බන්ධව පහත සඳහන් ප්‍රකාශ අතුරින් වැරදි ප්‍රකාශය කුමක්ද?

1) විකුණුම් පරිමාව වැඩිවීම නිසා සමච්ඡේදන ඒකක ප්‍රමාණය අඩුවේ.
2) මුළු ස්ථාවර පිරිවැය අඩුවීම නිසා සමච්ඡේදන ඒකක ප්‍රමාණය අඩුවේ.
3) ඒකකයක විකුණුම් මිල ඉහළ යෑම නිසා සමච්ඡේදන ඒකක ප්‍රමාණය අඩුවේ.
4) ඒකකයක විචල්‍ය පිරිවැය වැඩිවීම නිසා සමච්ඡේදන ඒකක ප්‍රමාණය වැඩිවේ.
5) විකුණුම් පරිමාව වැඩිවීම නිසා සමච්ඡේදන ඒකක ප්‍රමාණය වෙනස් නොවේ.

(30) යන්ත්‍රයක ජීවිතකාලය අවසානයේ දී එහි සුන්බුන් අගය රු. 60,000 ක් වන අතර ඊට අමතරව අනෙකුත් ද්‍රව්‍ය රු. 36,000 කට විකිණිය හැකි යැයි අස්තමේන්තු කර ඇත. එමෙන්ම අතිරේක කාරක ප්‍රාග්ධනය රු. 60,000 ආපසු අයකර ගත හැකිවේ. යන්ත්‍රයේ සුන්බුන් විකුණා ලැබෙන මුදල මත 40% ක් බදු ගෙවිය යුතුය. මෙම ආයෝජනයෙහි පර්යන්ත මුදල් ප්‍රවාහය වන්නේ,

1) රු. 140,000
2) රු. 132,000
3) රු.160,000
4) රු. 80,000
5) රු. 60,000

(31) LB ට්‍රේඩර්ස් හි හිමිකරු වන මාලිංග 2024 වර්ෂය තුළ තමාගේ ව්‍යාපාරයට යොදන ලද පෞද්ගලික මුදල් පිළිබඳ වාර්තා තබාගෙන නැත. පහත සඳහන් තොරතුරු LB ට්‍රේඩර්ස් හි ව්‍යාපාරයට අදාළ වේ.

| | රු. |
|---|---|
| 2023 අප්‍රේල් 01 දිනට ශුද්ධ වත්කම් | 120,000 |
| වර්ෂය සඳහා ලාභය | 73,000 |
| 2024 මාර්තු 31 දිනට මුළු වත්කම් | 260,000 |
| 2023 මාර්තු 31 දිනට මුළු වගකීම් | 30,000 |
| ගැනිලි | 20,000 |

ඉහත සඳහන් තොරතුරු පදනම මත ඔහු විසින් ම ව්‍යාපාරයට 2023/24 වර්ෂය තුළදී යෙදවූ අමතර ප්‍රාග්ධන මුදල වන්නේ,

..........................................................................................................................................................

(32) 2024.03.31 දිනට ආයතනයක මුළු වත්කම් හා මුළු වගකීම් පිළිවෙලින් රු. 1,000,000 ක් හා රු. 300,000 ක් විය.මෙම සංඛ්‍යා වලට එළඹීමේදී පහත වැරදීම් සිදු වී ඇත.

- 2024 අප්‍රේල් මාසයේදී භාණ්ඩ විකිණීම සඳහා ගනුදෙනුකරුවෙකුගෙන් ලබාගත් රු. 20,000 ක අත්තිකාරම්, අයභාරය ලෙස හඳුනාගෙන තිබීම.
- 2024 මාර්තු මාසය සඳහා නොගෙවූ 5,000 ක විදුලි බිල වාර්තාවලින් මග හැරීම.
- රු. 10,000 ක විකුණුම් ඉන්වොයිසියක් විකුණුම් ජ'නලයේ දෙවතාවක් වාර්තා කර තිබීම.

ඉහත වැරදි නිවැරදි කිරීමෙන් පසුව මුළු වත්කම් ප්‍රමාණය හා මුළු වගකීම් ප්‍රමාණය ගණනය කරන්න.

a) මුළු වත්කම් ......................................................................
b) මුළු වගකීම් ........................................................................

(33) නිෂ්පාදන ගිණුමක් පිළියෙල කිරීමේ අරමුණු 02 ක් සඳහන් කරන්න.

1. ......................................................................................................................................
2. ......................................................................................................................................

(34) ව්‍යාපාරයක නිෂ්පාදිත භාණ්ඩයක් වෙනුවෙන් පහත පිරිවැය දරන ලදී.

| | |
|---|---|
| ආරම්භක නොනිමි | රු. 12,000 |
| අවසන් නොනිමි | රු. 8,600 |
| ප්‍රාථමික පිරිවැය | රු. 40,000 |

| | |
|---|---|
| ආයතනයේ මුළු ශ්‍රමය | රු. 80,000 |
| වෙනත් නිෂ්පාදන පොදු කාර්යය | රු. 8,000 |
| කම්හල් වරිපනම් | රු. 6,000 |

ව්‍යාපාරයේ නොනිමි තොග ප්‍රාථමික පිරිවැයට අගය කර ඇත. ආයතනයේ මුළු සේවකයන්ගෙන් 50% ක් කම්හලේ සේවය කරන අතර ඉන් 30% ක් සෘජු සේවකයන් වේ. ගොඩනැඟිල්ලෙන් 70% ක් කාර්යාලයට අදාළ වේ. ආයතනයේ නිෂ්පාදන පිරිවැය කොපමණද?

..........................................................................................................................................................

(35) ණය ගැති පාලන ගිණුම සමඟ ණයගැති ලෙජරයේ ශේෂ ලැයිස්තුව සැසඳීමේ දී පහත සඳහන් වැරදි හඳුනාගන්නා ලදී.

- විකුණුම් දෛනික පොත රු. 60,000 ක් වැඩියෙන් එකතු කර ඇත.
- ආපසු එවුම් දෛනික පොත රු. 5,000 ක් අඩුවෙන් එකතු කර ඇත.
- ණයගැතියෙකුගේ පෞද්ගලික ගිණුමක් රු. 6,000 ක් අඩුවෙන් දක්වා ඇත.

මෙම වැරදි නිවැරදි කිරීමට පෙර ණයගැති ශේෂය රු. 340,000 ක් නම් නිවැරදි ණයගැති පාලන ගිණුමේ ශේෂය වන්නේ,

..........................................................................................................................................................

(36) ලාභ අරමුණු කර නොගත් සංවිධානයක 2023.04.01 දිනට සමුච්චිත අරමුදල රු. රු. 500,000 ක් විය. මෙහි සාමාජිකයන් 100 දෙනෙකු 2023/24 වර්ෂය තුළ සිටි අතර එක් අයෙකුගේ මාසික සාමාජික මුදල රු. 200 වූ අතර වර්ෂය තුල ලද සාමාජික මුදල රු. 264,000 ක් විය. සාමාජිකයින් 10 දෙනෙකු මෙම වර්ෂයටම සාමාජික මුදල් ගෙවා නොතිබූ අතර සාමාජිකයින් 20 දෙනෙකු 2024/25 වර්ෂයට අදාල සම්පූර්ණ සාමාජික මුදල් 2024.03.31 දින වන විට ගෙවා තිබුණි.2023/24 වර්ෂය සඳහා සාමාජික මුදල් හැර රු. 60,000 ක ආදායමක් පැවති අතර 2023/24 වර්ෂය සඳහා සංවිධානයේ වියදම රු. 100,000 ක් විය.වර්ෂය තුළ සමුච්චිත අරමුදලට බලපාන ගණුදෙනුවක් සිදු නොවූයේ නම් 2024.03.31 දිනට සමුච්චිත අරමුදල කීයද?

..........................................................................................................................................................

(37) සාමාන්‍ය කොටස් හා ණයකර අතර ප්‍රධාන වෙනස්කම් 02 ක් සඳහන් කරන්න.

1. ..........................................................................................................................
2. ..........................................................................................................................

(38) අසම්භාව්‍ය වගකීම් අතර වෙනස්කම් 2 ක් දක්වන්න.

| ප්‍රතිපාදන | අසම්භාව්‍ය වගකීම් |
|---|---|
| .............................................................. | .............................................................. |
| .............................................................. | .............................................................. |

(39) 2022.04.01 දින ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. මිලියන 90 ක් සහිතව සීමිත Myenrich.lk පොදු සමාගම ව්‍යාපාර කටයුතු ආරම්භ කරන ලදී.

පහත තොරතුරු 2022/23 – 2023/24 වර්ෂවලට අදාල වේ.

| විස්තර | (මිලියන) 2022/23 | (මිලියන) 2023/24 |
|---|---|---|
| මුළු ආදායම | 140 | 180 |
| මුළු වියදම (ආදායම් බදු හැර) | 170 | 120 |
| ආදායම් බදු | - | 10 |
| ගෙවූ ලාභාංශ | - | 30 |
| ප්‍රත්‍යාගනන සංචිත | - | 25 |
| මුළු වත්කම් | 100 | 170 |

i. 2023.03.31 දිනට සමාගමේ වගකීම් ප්‍රමාණය : ....................................................

ii. 2024.03.31 දිනට මුළු හිමිකම : ....................................................

(40) MyEnrich.lk සමාගම විසින් ගොඩනැගිල්ලක් ඉදිකරගැනීම සඳහා ACCA ආයතනය සමග ගිවිසුමකට එළඹුණි.මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම අදියර දෙකකින් සිදු වන අතර පලමු අදියර මෙම මූල්‍ය වර්ෂයේදී නිම කරනු ලබයි.සම්පූර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීමට රු. 1,000,000 වැය වන අතර පලමු අදියර සඳහා රු. 600,000ක් වැය වේ.

ඉහත ගනුදෙනුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 15 හි ආදායම හඳුනාගැනීමේ පියවර පහ අනුව සටහන් කරන්න.

A. ගිවිසුම හඳුනාගැනීම :……………………………………………..
B. කාර්ය සාධන බැඳුම්කර හඳුනාගැනීම :……………………………………………………
C. ගනුදෙනුවේ මිල තීරණය කිරීම :………………………………………………..
D. ගනුදෙනුවේ මිල කාර්ය සාධන බැඳුම්කර අතර බෙදා හැරීම :…………………………………..
E. ආදායම හඳුනාගැනීම :………………………………………………..

(41) වෙළෙඳ ව්‍යාපාරයක යෙදෙන සමාගමක පහත අයිතම මූල්‍ය ගිණුම්කරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව ආදායමක් ලෙස හඳුනාගත හැකිද යන්න සඳහන් කරන්න.

| | **අයිතමය** | **ආදායමක් ලෙස හඳුනා ගැනීම (ඔව්/නැත)** |
|---|---|---|
| A. | අත්පිට විකුණුම් | ........................................ |
| B. | ගොඩනැගිල්ලක් විකිණීමෙන් ලද මුදල | ........................................ |
| C. | ස්ථාවර තැන්පතුවක් මත ප්‍රවර්ථන වර්ෂය සඳහා ලැබිය යුතු පොලිය | ........................................ |
| D. | මෝටර් රථ ප්‍රථමවර ප්‍රත්‍යාගණනයෙන් ලද අතිරික්තය | ........................................ |

(42) ව්‍යාපාරයක් 2023.04.01 දින මිලට ගත් යන්ත්‍රයක ඵලදායි ජීව කාලය වර්ෂ 10 ක් ද පිරිවැය රු. 100,000 ක් ද විය. 2023.10.01 දින ඉහත යන්ත්‍රයට එකතු කළ රු. 20,000 ක් වටිනා කොටසක් හේතුවෙන් එහි කාර්යක්ෂමතාවය වැඩි වී ඇත. මෙම විශේෂ කොටසේ ඵලදායී ජීව කාලය වර්ෂ 5 කි.
2024.03.31 දිනට යන්ත්‍ර ධාරණ අගය දක්වන්න.

රු. ..............................................................................................................................................

(43) 2024.04.01 දින සමාගමක රු. 10,000 ක ආරම්භ තොගයක් තිබුණි. (ඒකකයක් රු. 50 බගින්) සමාගම තොග නිකුත් කිරීමට FIFO ක්‍රමය භාවිතා කරයි. 2022 අප්‍රේල් සඳහා තොරතුරු පහත පරිදි වේ.

- 4/02 ගැනුම් ඒකක 250 ඒකකයක් රු. 45 බැගින්
- 4/15 ගැනුම් ඒකක 100 ඒකකයක් රු. 55 බැගින්
- 4/17 නිකුත් කිරීම් ඒකක 250

- 4/19 නිකුත් කිරීම් ඒකක 150

i. අප්‍රේල් මාසයේ විකුණුම් පිරිවැය කොපමණද? ....................................................

ii. 2024.04.30 තොගයේ වටිනාකම කොපමණද? ......................................................

(44) සමාගමක් "බීටා" නම් වූ තනි භාණ්ඩයක් නිපදවනු ලබයි. පහත තොරතුරු එහි නිෂ්පාදනය සඳහා භාවිතා කරන අමුද්‍රව්‍යයකට අදාළ වේ.

- අමුද්‍රව්‍යයෙහි වාර්ෂික පරිභෝජනය ඒකක 10,000
- ඇණවුම් පිරිවැය ඇණවුමකට රු. 400
- රඳවා ගැනීමේ පිරිවැය ඒකකයකට රු. 200

පහත දෑ දක්වන්න.

i. මෙම අමුද්‍රව්‍යයේ ආර්ථික අණවුම් ප්‍රමාණය (EOQ) ……………………………..

ii. ආර්ථික අණවුම් මත පදනම් ව වසරකට කළ යුතු ඇණවුම් සංඛ්‍යාව ..................................

(45) නිෂ්පාදන ආයතයක් භාවිතා කරනු ලබන අමුද්‍රව්‍යකට අදාළ තොරතුරු පහත දැක්වේ.

| | උපරිම | අවම |
|---|---|---|
| පොරොත්තු කාලය (සති) | 8 | 4 |
| පරිභෝජනය (ඒකක) | 1,000 | 400 |
| ආර්ථික ඇණවුම් ප්‍රමාණය (ඒකක) | 5,000 | |

පහත දෑ ගණනය කරන්න.

i. අවම තොග මට්ටම ඒකක ..........................................................

ii. උපරිම තොග මට්ටම ඒකක ..........................................................

(46) ආර්ථික ඇණවුම් ප්‍රමාණය ආකෘතියේ උපකල්පන දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................................................................................
2. ..........................................................................................................................................

(47) 2024 ජුනි මාසය සඳහා සමාගමක වැටුප් සාරාංශය පහත දී ඇත.

| **විස්තරය** | **රු.** |
|---|---|
| මූලික වැටුප | 100,000 |
| දීමනා | 25,000 |
| සේවක අර්ථසාධක මුදල් අඩු කිරීම් | 8,000 |
| උත්සව අත්තිකාරම් අඩුකිරීම | 7,000 |
| ශුද්ධ වැටුප | 110,000 |
| සේවා අර්ථසාධක අරමුදල් දායකය | 12,000 |

ජුනි මාසය සඳහා සමාගමේ සේවකයින්ට අදාළ මුළු වියදම කොපමණද? .......................................

(48) සීමිත සමාගමක මූල්‍ය ප්‍රකාශනවලින් පහත තොරතුරු උපුටාගෙන ඇත.

| | 2024.03.31 | 2023.03.31 |
|---|---|---|
| තොගය | 240,000 | 160,000 |
| වෙළඳ ලබිය යුතු දෑ | 40,000 | 60,000 |

2024.03.31 න් අවසන් වර්ෂයේ මුලු විකුණුම් රු. 800,000 ක් වූ අතර එයින් 62.5% ක් ණයට විකුනුම් ය. දළලාභ අනුපාතය විකුණුම් මිලෙන් 25% කි. (වර්ෂයට දින 360 ක් ඇති බවට උපකල්පනය කරන්න.)

පහත දෑ ගණනය කරන්න.

i. තොග පිරිවැටුම් අනුපාතය ..........................................................................................

ii. ණය එකතු කිරිමේ කාලය ..........................................................................................

(49) සමාගමක් විසින් තනි භාණ්ඩයක් නිපදවනු ලබන අතර එම ඒකකයක් රු. 60 කට විකුණනු ලබයි. සමාගම ඒකක 16,000 විකුණන්නේ නම් ඒකකයක අලාභය රු. 10 ක් වන අතර ඒකක 40,000 ක් විකුණන්නේ නම් ඒකකයක ලාභය රු. 8 කි.

පහත දෑ දක්වන්න.

(අ) මුළු ස්ථාවර පිරිවැය රු. ..........................................................................................

(ආ) ඒකක දායකය රු. ..........................................................................................

(ඉ) සමච්ඡේදන ලක්ෂ්‍ය ඒකක : ..........................................................................................

(50) ඵලදායීව ජීව කාලය වසර 5 ක් සහ සුන්බුන් අගය රු. 300,000 ක් වූ නව යන්ත්‍රයක් රු. 1,000,000 කට මිල දී ගැනීමට සැලසුම් කරමින් සිටී. මෙම යන්ත්‍රයෙන් සෑම වර්ෂයකදීම රු. 110,000 ක වාර්ෂික ලාභයක් ඉපැයීමට අපේක්ෂා කෙරේ. මෙම යන්ත්‍රයෙන් ජනනය වන මුදල් ප්‍රවාහයන් එහි ඵලදායි ජීව කාලය තුළ සමානව සිදුවේ යැයි අපේක්ෂා කෙරේ.

මෙම ව්‍යාපෘතිය සඳහා පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) 5 වන වර්ෂයේ ශුද්ධ මුදල් ප්‍රවාහය රු. ..........................................................................................

(ආ) පිළිගෙවුම් කාලය (වසර) රු. ..........................................................................................

සියලු ම හිමිකම් ඇවිරිණි/அனைத்து உரிமைகளும்/All Right Reserved

WWW.QUESTIONBANK.LK

# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය

**ගිණුම්කරණය** | 33 S II | **පැය තුනයි**

අමතර කියවීම් කාලය - මිනිත්තු (10) යි
Additional Reading Time - 10 minutes

විභාග අංකය :..............................................................

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කරගැනීමටත් යොදා ගන්න

වැඩසටහන් සම්පාදනය කල නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.

**උපදෙස්**
* **පළමුවන** හා **දෙවන** ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම **අලුත් කඩදාසියකින්** ආරම්භ කරන්න.
* අදාල පෙරවැඩ, පිළිතුරු පත්‍රය සමග අමුණන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු **200** ක් හිමි වේ.

01. සීමිත MyEnrich.lk පොදු සමාගමේ 2024.03.31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම පහත දී ඇත.

| | හර රු.000 | බැර රු. 000 |
|---|---|---|
| ඉඩම් (ප්‍රත්‍යාගණන අගය) | 4 000 | |
| ගොඩනැගිලි | 2 500 | |
| මෝටර් රථ | 3 500 | |
| උපකරණ | 1 500 | |
| ක්ෂය වෙන්කිරීම 2023.04.01 | | |
| ගොඩනැගිලි | | 850 |
| මෝටර් රථ | | 1 100 |
| උපකරණ | | 450 |
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය (200,000) | | 6 000 |
| විකුණුම් | | 15 260 |
| විකුණුම් වගකීම් සහතික වෙන් කිරීම 2023.04.01 | | 800 |
| විකුණුම් පිරිවැය | 6 500 | |
| වෙළෙඳ තොගය - 2024.03.31 දිනට | 650 | |
| බෙදා හැරීමේ වියදම් | 1 410 | |
| පරිපාලන වියදම් | 2 090 | |
| වෙනත් වියදම් | 220 | |
| මූල්‍ය වියදම් | 500 | |
| බදු වෙන් කිරීම 2023.04.01 | | 300 |
| ගෙවූ බදු | 1 300 | |
| වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | | 1 440 |
| රඳවාගත් ලාභ | | 3 360 |
| ලද කොමිස් | | 120 |

| | | |
|---|---|---|
| භාණ්ඩාගාර බිල් ( ත්‍රෛමාසික ) | 600 | |
| මුදල් ශේෂය | 720 | |
| වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 4 190 | |
| | 29 680 | 29 680 |

**අනෙකුත් තොරතුරු,**

I. 2024.03.31 දිනට පවතින තොගය තුළ ඇතුළත් පිරිවැය රු 150,000 ක තොගයේ එදිනට ඇස්තමේන්තු ශුද්ධ උපලබ්ධි අගය රු 200,000 කි. පසුව එම තොගය 2024.04.20 වන දින රු. 60,000 ක විකුණුම් වියදමක් දරා රු 200,000 කට විකුණා ඇත.

II. රු. 200,000 ක ගැණුම් ඉන්වොයිසියක් සටහන් කිරීම මඟ හැරී ඇත.

III. පරිපාලන වියදම් පිළිබඳ විශ්ලේෂණය මෙසේය.

| | **රු.000** |
|---|---|
| ගෙවූ වැටුප් | 900 |
| අධ්‍යක්ෂ සංවේතන | 800 |
| විගණන ගාස්තු | 120 |
| පොදු වියදම් | 270 |

IV. වැටුප් ගිණුමෙන් දැක්වන්නේ සේවක අර්ථ සාධක අරමුදල සඳහා 10% ක සේවක දායකය අඩු කිරීමෙන් පසු ගෙවූ ශුද්ධ වැටුප වේ. මීට අමතරව සමාගම 15% ක දායකයක් ගෙවිය යුතු අතර 3% ක සේවක භාරකාර අරමුදල් දායකයක් ගෙවිය යුතුය.

V. 2024.03.31 දිනට උපචිත වැටුප් රු. 200,000

VI. සමාගම භාණ්ඩ විකිණීමේ දී වර්ෂයක වගකීම් සහතිකයක් සහිතව භාණ්ඩ අලෙවි කරයි. පසුගිය වර්ෂයේ විකුණුම් වගකීම් සහතික මත දැරූ රු. 260,000 ක අලුත්වැඩියා වියදම වැරදීමකින් විකුණුම් ගිණුම හර කර මුදල් ගිණුමට බැර කර ඇත. 2023/24 වර්ෂයේ විකුණුම් මත රු. 750,000 ක් වගකීම් සහතික සඳහා වෙන් කිරීම කළ යුතුය.

VII. 2024.03.31 දිනට ඉඩම රු. 4,700,000 ට ප්‍රත්‍යාගණනය කර ඇත. මෙම ඉඩම පෙර වර්ෂයේ දී ප්‍රත්‍යාගණනය කිරීමෙන් ලද රු. 500,000 ක ප්‍රත්‍යාගණන අලාභය ආදායම් ප්‍රකාශයට හර කර ඇත.

VIII. 2023.04.01 දින පිරිවැය රු. 3,000,000 ට මෝටර් රථයක් කල්බදු ක්‍රමයට අත්පත් කර ගන්නා ලදී. ගිවිසුම අනුව මූලික තැන්පතුව ලෙස රු. 500,000 ක් ගෙවා ඉතිරිය රු. 660,000 බැගින් වාර්ෂික වාරික 5ක් ගෙවීමෙන් පසු මෝටර් රථය ව්‍යාපාරයට අයිති වේ. ගෙවූ තැන්පතු මුදල මූල්‍ය වියදම් යටතේ දක්වා ඇත. ගෙවූ පළමු වාරිකය බෙදාහැරීමේ වියදම් යටතේ වාර්තා කිරීම හැර වෙනත් සටහනක් නැත. මෝටර් රථ පිරිවැය මත 20% ක් ක්ෂය කෙරේ. වසර 2 ක කාලය සඳහා අදාල කල්බදු පොළිය මෙසේය.

| **වසර** | **පොලිය රු. 000** |
|---|---|
| 2023/24 | 270 |
| 2024/25 | 202 |

IX. ගොඩනැගිලි, මෝටර් රථ හා උපකරණ වාර්ෂිකව පිළිවෙලින් 5%, 20% හා 10% ලෙස සරල මාර්ග ක්ෂය ක්‍රමය යටතේ ක්ෂය කරනු ලබයි.

X. සමාගමට විරුද්ධව ඉවත් කළ සේවකයෙකු පැවරූ නඩුවකට 2024.03.31 වන විටත් තීන්දුව ලැබී නොතිබිණි. සමාන නඩු කාරණාවක් සම්බන්ධයෙන් පෙර වර්ෂයක අස්කල සේවකයකුට රු 500,000 ක වන්දියක් ගෙවීමට අධිකරණ තීන්දුවක් මත සමාගමට සිදු වී ඇත.

XI. 2023/24 ඇස්තමේන්තු ආදායම් බද්ද රු. 1,000,000

XII. අධ්‍යක්ෂවරු 2024.03.31 දිනට පහත තීරණ ගෙන ඇත.

- 2024.03.31 පැවති සෑම සාමාන්‍ය කොටස් 2 ට 1 ක් බැගින් වන සේ එකක් රු. 30 බැගින් වූ සංචිත ප්‍රාග්ධනීකරණය (රඳවාගත් ඉපැයුම් භාවිතා කිරීම )
- පොදු සංචිතයට රු. 100,000ක් මාරු කිරීම
- සාමාන්‍ය කොටස් සඳහා කොටසකට රු. 10ක ලාභාංශයක් යෝජනා කිරීම.

**අවශ්‍ය වන්නේ,**

1. 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය
2. 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය
3. 2024.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

02. (අ) සීමිත ලෙදර් ඩිසයින් සමාගම බෑග් නිපදවා අලෙවිකරණ අතර එහි සැකසුම් නිමැවුම් යන නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් ද ගබඩා අංශයක් ද පවතී. මෙම සමාගම 2024.04.30 මාසය සඳහා බෑග් 1,000 ක් නිෂ්පාදනය කිරීම පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

සීමිත ලෙදර් ඩිසයින් සමාගමේ තොග පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| දිනය | විස්තරය | ප්‍රමාණය (ඒකක) | ඒකක මිල (රු.) |
|---|---|---|---|
| 04/01 | ශේෂය | 1 000 | 100 |
| 04/08 | ගැණුම් | 2 000 | 120 |
| 04/15 | නිකුතු කිරීම් | 1 500 | |
| 04/17 | ගැණුම් | 2 000 | 140 |
| 04/20 | ආපසු යැවුම් | 500 | (04/08 මිලදී ගත්) |
| 04/20 | නිකුත් කිරීම් | 1 500 | |

තොග නිකුත් කිරීම මිල කිරීම සඳහා FIFO ක්‍රමය භාවිතා කරයි. නිකුත් කළ අමුද්‍රව්‍ය සියල්ල පරිභෝජනය කර ඇත.

සේවක වැටුප් පිළිබඳ තොරතුරු පහත පරිදිය.

| | මූලික වැටුප | අතිකාල | EPF සේවක දායකය | සුභසාධන වාරි අඩුකිරීම | EPF සේව්‍ය | ETF සේව්‍ය |
|---|---|---|---|---|---|---|
| නිෂ්පාදන සේවක | 50 000 | 10 000 | 5 000 | 500 | 7 500 | 1 500 |
| නිෂ්පාදන සුපරීක්ෂක | 50 000 | 10 000 | 3 000 | 500 | 7 500 | 1 500 |
| නිෂ්පාදක කළමනාකරණ සේවක | 40 000 | 5 800 | 4 000 | 500 | 6 000 | 1 200 |

නිෂ්පාදන පොදු කාර්යය තොරතුරු පහත පරිදිය.

- වක්‍ර වැටුප් සැකසුම් සහ නිමැවුම් දෙපාර්තමේන්තු අතර සමානව විභාජනය කරයි.
- සැකසුම් දෙපාර්තමේන්තුව යන්ත්‍ර පැය පදනම මත ද නිමැවුම් දෙපාර්තමේන්තුව ඍජු ශ්‍රම පැය පදනම මතද පොදු කාර්යය පිරිවැය අන්තර්ග්‍රහණය කරයි.
- බෑගයක් නිෂ්පාදනය කිරීමට යන්ත්‍ර පැය 5ක් ද ශ්‍රම පැය 8 ක් ද වැය වේ.

| අයිතමය | මුළු එකතුව | සැකසුම් | නිමැවුම් | ගබඩා |
|---|---|---|---|---|
| වක්‍ර ද්‍රව්‍ය | 32 500 | 7 300 | 25 200 | |
| විදුලිය | 90 000 | | | |
| කුලී | 100 000 | | | |

| | | | | |
|---|---|---|---|---|
| සේවක රක්ෂණය | 18 000 | | | |
| භූමි ප්‍රමාණය | 10 000 | 5 000 | 3 000 | 2 000 |
| සේවක සංඛ්‍යාව | | 1 | 1 | 1 |
| ගබඩා අධියාචනා පත්‍ර | | 40 | 70 | |
| යන්ත්‍ර පැය | | 1 000 | | |
| ඍජු ශ්‍රම පැය | | | 1 772 | |

**අවශ්‍ය වන්නේ,**

1. මාසය තුළ පරිභෝජනය කළ ඍජු ද්‍රව්‍ය පිරිවැය
2. 2024.04.30 දිනට අවසාන තොගය
3. ඍජු ශ්‍රම පිරිවැය
4. පොදු කාර්යය පිරිවැය විභජන පත්‍රිකා
5. සැකසුම් නිමැවුම් අංශ වල අන්තර්ග්‍රහණ අනුපාතය
6. ඒකකයක නිෂ්පාදන පිරිවැය
7. මුළු පිරිවැය

(ආ) ACCA සමාගමේ 2024 ජනවාරි මාසය සඳහා වූ වේතන සාරාංශය පහත දී ඇත.

| | | රු. |
|---|---|---|
| මූලික වේතනය | | 100 000 |
| අතිකාල ගෙවීම | | 4 000 |
| ජීවන අංක දීමනාව | | 10 000 |
| දළ වේතනය | | 150 000 |
| අඩු කිරීම්: | | |
| සේවක අර්ථසාධක අරමුදල | 10 000 | |
| සේවක ණය අය කිරීම | 18 000 | |
| වෘත්තීය සමිති සාමාජික ගාස්තු | 2 000 | |
| මුළු අඩු කිරීම් | | -30 000 |
| ශුද්ධ වේතනය | | 120 000 |
| සේවා යෝජකයාගේ දායක මුදල් | | |
| සේවා අර්ථසාධක අරමුදල | | 15 000 |
| සේවා නියුක්ති භාර අරමුදල | | 3 000 |

සමාගම විසින් මාසික සේවක අර්ථසාධක අරමුදල් දායකය හා සේවා නියුක්ති භාර අරමුදල් දායක ඊළඟ මාසය තුළ දී ගෙවනු ලබයි. සෑම මසකම අවසාන දිනයේදී මාසික වැටුප් ගෙවනු ලබයි. 2024 ජනවාරි 01 දිනට පහත ගිණුම් ශේෂ ද දී ඇත.

| | රු. |
|---|---|
| ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් ගිණුම | 3 600 |
| ගෙවිය යුතු සේවා නියුක්ති භාර අරමුදල් ගිණුම | 30 000 |
| සේවක ණය ගිණුම | 425 000 |

**අවශ්‍ය වන්නේ,**

2024 ජනවාරි මාසය සඳහා පහත සඳහන් ලෙජර් ගිණුම්

1. වේතන පාලන ගිණුම
2. ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් ගිණුම
3. ගෙවිය යුතු සේවා නියුක්ති භාර අරමුදල් ගිණුම
4. සේවක ණය ගිණුම

03. (අ) කුමුදු ව්‍යාපාරය 2024 ජනවාරි 01 දින ආරම්භ කළේය. ජනවාරි මාසයේ ගනුදෙනු පහත පරිදි සමීකරණයේ පෙළගස්වා ඇත. (ව්‍යාපාරය VAT සඳහා ලියාපදිංචි වී ඇති අතර VAT අනුපාතය 8% කි.)

| අංකය | වත්කම් | | | | | වගකීම් | | හිමිකම් | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | දේපළ පිරියත උපකරණ | වෙළඳ අගය | වෙළඳ ලැබිය යුතු | ලැබිය යුතු VAT | මුදල් | වෙළඳ ගෙවිය යුතු | ගෙවිය යුතු VAT | ප්‍රාග්ධනය | රඳවාගත් ඉපැයුම් |
| | | | | | | | | | |
| 1 | 1 000 | | | | 1 500 | | | 2 500 | |
| 2 | | 800 | | 64 | (864) | | | | |
| 3 | | (400) | 648 | | | | 48 | | 200 |
| 4 | | 400 | | 32 | | 432 | | | |
| 5 | | | | | (50) | | | | (50) |
| 6 | | | (200) | | 200 | | | | |
| 7 | | | 200 | | (200) | | | | |
| 8 | | (600) | | | 972 | | 72 | | 300 |
| 9 | | | | 16 | (216) | | | | (200) |
| 10 | | | | | 700 | | | | 700 |
| 11 | (20) | | | | | | | | (20) |
| 12 | | | (150) | | (200) | (350) | | | |

**අමතර තොරතුරු,**

I. ඉහත අංක (05) යටතේ දක්වා ඇති ගනුදෙනුව හැර අනෙකුත් රඳවාගත් ඉපැයුම් වෙනස්වීම් ලාභයට බලපානු ලබයි.

II. සියලුම මුදල් ගනුදෙනු චෙක්පත් හරහා බැංකු ගිණුමක් ආශ්‍රයෙන් සිදු කළ අතර, 2022 ජනවාරි බැංකු ප්‍රකාශනය ලද පසු හඳුනාගත් තොරතුරු පහත දැක්වේ.

- බැංකු අයකළ සේවා ගාස්තු රු. 13 000
- ණය ගැතියන් විසින් ඍජුව තැන්පත් කළ මුදල් රු. 48 000.
- ස්ථාවර නියෝග මත ගෙවූ බදු කුලිය රු. 135 000 (8% VAT ඇතුළත් වේ.)
- තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක් රු. 1 428 000
- නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකල චෙක් රු. 330 000

**අවශ්‍ය වන්නේ,**

1. අමතර තොරතුරු ද සැලකිල්ලට ගනිමින් ඉහත ගනුදෙනු විස්තර කරන්න
2. 2024 ජනවාරි මාසයේ ලාභය හෝ අලාභය ගණනය කරන්න
3. 2024 ජනවාරි 31 දිනට සංශෝධිත මුදල් ගිණුම
4. 2024 ජනවාරි 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය

(ආ) තිළිණගේ ව්‍යාපාරයේ 2023.03.31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම තුලනය නොවූ හෙයින් වෙනස අවිනිශ්චිත ගිණුමක ලියා තබන ලදී. එදිනට කෙටුම්පත් කරන ලද ආදායම් ප්‍රකාශනයට අනුව වර්ෂය සඳහා ලාභය රු. 650,000 ක් විය. පසුව ගිණුම් පරික්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

I. විකුණුම් ජර්නලයේ වටිනාකම් තීරුවේ එකතුව රු. 450,000 විකුණුම් ගිණුමට පිටපත් කර තිබුණේ රු. 540,000 ක් ලෙසය.

II. ණයගැතියෙකුගේ අය වියයුතු රු. 14,000 ක් හානිකරණ අලාභ (බොල් ණය) ලෙස කපා හැර ඇතත් ඒ පිළිබඳ පොදු ලෙජරයේ සටහනක් තබා නැත.

III. 2022.10.01 දින මිලදී ගත් රු. 60,000 කාර්යාල උපකරණ කාර්යාල වියදම් ගිණුමට හර කර ඇත. ව්‍යාපාරය සියලු දේපල පිරියත උපකරණ පිරිවැය මත 10% බැගින් ක්ෂය කරනු ලැබේ.

IV. බැංකු ණය සඳහා ගෙවූ පොලී ලද පොලී ගිණුමට බැර කර ඇත.

V. ඉදිරි වර්ෂය සඳහා ලද විකුණුම් අත්තිකාරම් රු. 40,000 විකුණුම් ගිණුමට බැර කර ඇත.

VI. මෝටර් රථ ගිණුමේ ශේෂය වූ රු. 4,000,000 ක් ශේෂ පිරික්සුමේ සටහන් කර ඇත්තේ රු. 400,000 ක් ලෙසය.

VII. රු. 25,000 ක භාණ්ඩ ණයට ගැනුම් පිළිබඳ ඉන්වොයිසිය සම්පූර්ණයෙන් මගහැරී ඇත.

VIII. මුදල් ගෙවීම් ජර්නලයේ වට්ටම් තීරුවේ එකතුව වූ රු. 30,000 ක් ලද වට්ටම් ගිණුමට හර කර ණයහිමි පාලන ගිණුම බැර කර ඇත.

IX. 2023.03.31 දිනට තොගවල ශුද්ධ උපලබ්ධි අගය පිරිවැයට වඩා රු. 35,000 ක් අඩුවිය. එසේ නමුත් වර්ෂයේ ලාභය ගණනයේදී අවසන් තොගය පිරිවැයට තක්සේරු කර ඇත.

අවශ්‍ය වන්නේ,

1. ඉහත වැරදි නිවැරදි කිරීමට අදාළ ජනල් සටහන්
2. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිවැරදි ශුද්ධ ලාභය
3. ඉහත (II), (III), (V) හා (IX) යන වැරදි හා මගහැරීම් වලට අදාල ගිණුම්කරණ සංකල්ප

04. (අ) රංග හා සුරංග පිළිවෙලින් 5:3 අනුපාතයට ලාභලාභ බෙදා ගනිමින් පවත්වාගෙන යන හවුල් ව්‍යාපාරයේ කළමනාකරු ලෙස කටයුතු කළ විරංග 2023.04.01 දින සිට 1/5 හිමිකමකට යටත්ව නව හවුල්කරුවකු ලෙස බඳවා ගන්නා ලදී. මෙය නිමිති කරගෙන කීර්තිනාමය රු. 80,000 කට අගය කරන ලද අතර, විරංග තම ප්‍රාග්ධනය හා කීර්තිනාම කොටස වශයෙන් රු. 1,000,000 ක් වටිනා වෑන් රථයක් හා මුදලින් රු. 16,000 ක් ගෙන එන ලද අතර ඇතුළත් වේ. එය ඔහුගේ නමින් ගිණුමකට බැර කර ඇත. ඔවුන්ගේ හවුල් ගිවිසුමේ පහ කොන්දේසි ඇතුලත් වේ.

- හවුල්කරුවන්ගේ ගැලපු ප්‍රාග්ධන පර්යේෂ මත 10% ක වාර්ෂික පොලියක් ගෙවීම.
- රංගට හා විරංගට තම සේවය වෙනුවෙන් මසකට රු. 10,000 බැගින් වේතන ගෙවීම හා එය 2023.10.01 සිට මසකට රු. 11,000 ක් බැගින් ගෙවීම.
- කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුම මගින් ගැලපීම.

ව්‍යාපාරයේ ගිණුම් තබන්නා 2024.03.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| විස්තරය | හර | බැර |
|---|---|---|
| | **රු 000** | **රු 000** |
| දේපල පිරියත උපකරණ | 7 000 | |
| ජංගම වත්කම් | 275 | |
| පරිපාලන වියදම් | 300 | |
| බෙදා හැරීමේ වියදම් | 250 | |
| මූල්‍ය වියදම් | 25 | |
| විකුණුම් පිරිවැය | 2 000 | |
| විකුණුම් | | 4 427 |
| 2023.04.01 ට ප්‍රාග්ධන ගිණුම - රංග | | 1 590 |
| සුරංග | | 1 194 |
| 2023.04.01 ට ජංගම ගිණුම් -රංග | | 200 |
| සුරංග | | 150 |
| 10% බැංකු ණය (2023.04.01 ලබාගත්) | | 500 |
| ණය ගිණුම - රංග (2023.04.01 ලබාගත්) | | 500 |
| වීරංගගේ ගිණුම | | 1 016 |
| ජංගම වගකීම් | | 173 |
| දේපල පිරියත උපකරණ සමුච්චිත ක්ෂය | | 300 |
| | 9 850 | 9 850 |

අතිරේක තොරතුරු

I. දේපල පිරියත හා උපකරණ සරල මාර්ග ක්‍රමයට 10% ක්ෂය කර ඇති නමුත් වීරංග ගෙනා මෝටර් රථය ක්ෂය කර නොමැත.

II. පරිපාලන වියදම් තුල පහත වියදම් ද ඇතුළත් වේ.

- අදාළ හවුල්කරුවන් මුල් මාස 6 සඳහා ලබාගත් වේතන
- රංගගේ ආදායම් බදු රු. 20,000 ව්‍යාපාර මුදලින් ගෙවීම

III. වීරංගගේ භාණ්ඩ ගැනිලි රු. 15,000 ගිණුම්ගත කර නැත.

IV. අවුරුදු උත්සවයක් වෙනුවෙන් පරිත්‍යාග කළ රු. 10,000 ක මුදල් පරිත්‍යාගය ගිණුම් ගත කිරීම මග හැරි ඇත.

V. රංගගෙන් ලබාගත් ණය මුදලට ගෙවිය යුතු පොලී සම්බන්ධ එකඟතාවක් නොමැති බැවින් පොලී ගණන් බලා නොමැත.

VI. රු. 80,000 ක වාර්ෂික කුලී පදනම යටතේ 2023.10.01 සිට ව්‍යාපාරයේ කොටසක් රංගට අයිති ගොඩනැගිල්ලක පවත්වාගෙන යන නමුත් අදාළ කුලී ගෙවීම් කර නොමැති අතර, ගිණුම් තැබීමක්ද කර නොමැත.

**අවශ්‍ය වන්නේ,**

1. රංග, සුරංග හා විරංග හවුල් ව්‍යාපාරයේ 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය
2. 2024.03.31 දිනෙන් අවසන් වර්ෂයේ හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හා ජංගම ගිණුම්

(ආ) 2023.04.01 දිනට සී/ස දුස්රා සමාගමේ පොත් වලින් පහත තොරතුරු ලබාගෙන ඇත.

| මෝටර් රථ | පිරිවැය | සමුච්චිත ක්ෂය | සුන්බුන් අගය | ඵලදායී ජීවකාලය(වර්ෂ) |
|---|---|---|---|---|
| 1 | 3 500 | 1 200 | 200 | 10 |
| 2 | 6 700 | 1 600 | 700 | 5 |
| 3 | 2 300 | 200 | 300 | 5 |

2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු අදාළ වේ.

I. අංක 01 දරන රථය 2024.01.01 දින අනතුරට පත් වී ඇත. ඒ වෙනුවෙන් පිළිසකර කිරීම් සඳහා රු. මිලියන 1.2 ක් වැය වූ අතර, රක්ෂණ සමාගම විසින් එයින් 80% ක වන්දියක් ලබා දීමට එකඟ වී ඇත. කිසිවක් මෙතෙක් ගිණුම් වල ගලපා නැත.

II. අංක 02 දරන රථය 2023.10.01 දින ආයු පරීක්ෂාවක් කර ඇත. එදින සිට ඉදිරි වර්ෂ 2 පමණක් මෙම රථය භාවිතා කල හැකි වන බවට නව ඇස්තමේන්තුවක් කර ඇත. සුන්බුන් අගය රු. 500,000 කට සීමාවන බව තීරණය කර ඇත.

III. පරිපාලන කටයුතු සඳහා භාවිතා කල, අංක 03 දරන රථය 2024.01.01 දින රු. මිලියන 2.1 කට විකුණා ඒ සඳහා අංක 04 දරන රථය එදිනම මිලියන 2 කට මිලදී ගෙන ඇත. මෙහි සුන්බුන් අගයක් නොමැති අතර, ඵලදායි ජීව කාලය වසර 5 කි.

IV. විශේෂයෙන් සඳහන් කර නොමැති අනිකුත් මෝටර් රථ, බෙදා හැරීමේ කටයුතු සඳහා භාවිතා කරයි.

**අවශ්‍ය වන්නේ,**

1. ඉහත ( 1 ) ගැලපීම සඳහා අවශ්‍ය පොදු ජර්නල් සටහන්
2. 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශන උද්ධෘතයන්
3. 2024.03.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනයේ පෙන්විය යුතු වන දේපළ පිරියත හා උපකරණ සටහනෙහි මෝටර් රථ සඳහා අදාල කොටස දක්වන්න.

05. (අ) සීමිත MyEnrich.lk සමාගමේ පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන ඔබ වෙත ඉදිරිපත් කර ඇත.

**MyEnrich.lk සමාගමේ**

03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන (,000)

| | 2023.03.31 | 2024.03.31 |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | |
| දේපළ පිරියත උපකරණ | 6 000 | 7 800 |
| **ජංගම වත්කම්** | | |
| තොගය | 350 | 380 |
| වෙළඳ ලැබිය යුතු දෑ | 310 | 300 |
| ත්‍රෛමාසික භාණ්ඩාගාර බිල්පත් | 50 | - |
| බැංකු ශේෂය | 250 | 490 |
| | 6 960 | 8 970 |
| **හිමිකම්** | | |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 5 000 | 6 500 |
| (කොටසක් රු. 20) | | |
| පොදු සංචිතය | 200 | 250 |
| රඳවා ගත් ලාභ | 600 | 600 |
| **ජංගම නොවන වගකීම්** | | |
| 20% ණයකර | 300 | 400 |
| **ජංගම් වගකීම්** | | |
| වෙළඳ ගෙවිය යුතු දෑ | 400 | 710 |
| උපචිත පොළී | - | 20 |
| උපචිත බදු | 60 | 90 |
| ගෙවිය යුතු අතුරු ලාභාංශ | 400 | 400 |
| | 6,960 | 8,970 |

**MyEnrich.lk සමාගමේ**

**2024.03.31 න් අවසන් වර්ෂය සඳහා**

| ආදායම් ප්‍රකාශනය | රු.000 |
|---|---|
| විකුණුම් | 7 500 |
| විකුණුම් පිරිවැය | -3 500 |
| | 4 000 |
| වෙනත් ආදායම් | 550 |
| | 4 550 |
| මෙහෙයුම් වියදම් | -2 150 |
| ක්ෂය වීම් | -450 |
| පොලී වියදම | -60 |
| බදු පෙර ලාභය | 1 890 |
| ආදායම් බදු | -290 |
| වර්ෂයේ ලාභය | 1 600 |

**අතිරේක තොරතුරු,**

I. ධාරණ අගය රු. 1,700,000 ක් වූ වෑන් රථයක් විකිණීමෙන් ලද ලාභය වෙනත් ආදායම් තුල ඇතුළත්ව ඇත.
II. නව ගබඩා ගොඩනැගිල්ලක් මිලට ගත් අතර එය නියමිත පරිදි වාර්තා කර ඇත.
III. රඳවාගත් ලාභ උපයෝගී කරගෙන 2023.04.01 දිනට පැවති සෑම සාමාන්‍ය කොටස් 05 කට 1 බැගින් වනසේ එකක් රු. 20 බැගින් වූ ප්‍රකාශිත අගයට සංචිත ප්‍රාග්ධනිත කර ඇත.
IV. වර්ෂය තුළ හිමිකම් නිකුතුවක් සිදුකල අතර ලද මුදල් නියමිත පරිදි වාර්තාකර ඇත.
V. 2024.03.31 දින ණයකර නිකුතුවක් සිදුකර ඇත.
VI. වර්ෂය අගදී සාමාන්‍ය කොටස් හිමියන්ට ලාභාංශ ප්‍රකාශ කර ගෙවා ඇත.

**අවශ්‍ය වන්නේ,**

LAKS 7 අනුව 2024.03.31 න් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(ආ) 2024.03.31 දිනට Win Boys සුබසාධක සංගමයේ ශේෂ පිරික්සුම පහත දී ඇත.

| | **හර (රු. '000)** | **බැර (රු. '000)** |
|---|---|---|
| මුදල් | 50 | |
| ගෙවූ මුදල් අත්තිකාරම් | 100 | |
| වාර්ෂික 10% ස්ථාවර තැන්පතු | 60 | |
| ලැබූ පොලී | | 6 |
| 2023.04.01 දිනට ලිපිද්‍රව්‍ය | 2 | |
| මිලදී ගත් ලිපිද්‍රව්‍ය | 21 | |
| උපකරණ | 80 | |
| 2024.03.31 දිනට උපකරණ ක්ෂය වෙන්කිරිම | | 48 |
| උපකරණ ක්ෂය | 8 | |
| පරිපාලන වියදම් | 50 | |
| කාර්යාලිය කුලි | 30 | |
| සුබසාධන වියදම් | 174 | |
| 2023.04.01 දිනට හිඟ සාමාජික මුදල් | 25 | |
| 2023.04.01 දිනට කලින් ලද සාමාජික මුදල් | | 15 |
| ලැබූ සාමාජික මුදල් | | 272 |
| 2023.04.01 දිනට සමුච්චිත අරමුදල | | 259 |
| | **600** | **600** |

**අතිරේක තොරතුරු,**

I. 2024 මාර්තු 31 දිනට ලිපිද්‍රව්‍ය තොගය රු. 3,000
II. 2024 මාර්තු 31 දිනට හිඟ සහ කලින් ලද සාමාජික මුදල් පිළිවෙලින් රු. 40 000 ක් සහ රු. 10 000ක් විය.
III. 2023.04.01 දිනට හිඟ සාමාජික මුදල්වලින් රු. 10 000 ක් අයකර ගත නොහැකි බව හෙළිදරව් කරගන්නා ලදී.
IV. භෞතික මුදල් ශේෂය රු 5,600 කින් අඩු වූ අතර, මෙය කසාහැරීමට තීරණය කරන ලදී.
V. ශේෂ පිරික්සුමෙහි දක්වා ඇති "මුදල් අත්තිකාරම්" මගින් පෙන්නුම් කරනුයේ 2024 ජනවාරි 01 දින පොත් අලෙවිසැලක් පවත්වා ගෙන යාමට සංගමය මගින් පත් කල සුබසාධක කමිටුවට ලබා දුන් මුදල් වේ.කමිටු සභාපති විසින් පහත සඳහන් තොරතුරු සපයා ඇත.
VI. 2024 මාර්තු 31 දිනට පොත්පත් හා සගරා තොගය රු 120 000 ක් විය.
VII. මුදල් පොතේ සාරාංශය

| | **හර (රු. '000)** | **බැර (රු. '000)** |
|---|---|---|
| මුදල් අත්තිකාරම් | | 100 |
| පොත්පත් හා සඟරා විකුණුම් | | 300 |
| අඩුකළා | | 400 |

| | | |
|---|---|---|
| පොත්පත් හා සඟරා සැපයීම සඳහා ගෙවීම් | 280 | |
| ලී බඩු මිලදී ගැනුම් | 40 | |
| විකුණුම් කාර්ය මණ්ඩල වැටුප් | 15 | |
| ප්‍රවාහන වියදම් | 5 | 340 |
| 2024.03.31 දිනට මුදල් ශේෂය | | 60 |

- සාමාජිකයින් විසින් පරිත්‍යාග කරන ලද පොත්වල වටිනාකම රු. 75,000 ක් වූ අතර මෙයින් රු. 50,000 ක පොත් 2024 මාර්තු 31 දින වන විට විකුණා නොතිබිණි. මෙය 2024 මාර්තු 31 දින තොගයේ ඇතුලත්ව නැත.
- මාස තුන සඳහා ලී බඩුවල ක්ෂය රු. 5,000 කි.
- කාර්යාලීය කුලිවලින් 1/3 ක් පොත් අලෙවිසැලට අය කළ යුතු වේ.
- 2024 මාර්තු 31 දිනට පොත්පත් සහ සඟරා සැපයුම්කරුවන්ට ගෙවිය යුතු මුදල රු 40,000 කි.

**අවශ්‍ය වන්නේ,**

1. සාමාජික මුදල් ගිණුම
2. 2024 මාර්තු 31 දිනෙන් අවසන් මාස තුන සඳහා පොත් අලෙවිසැල් ලාභ හෝ අලාභය ගණනය කර පෙන්වන ප්‍රකාශයක්
3. 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සුබසාධක සංගමයේ ආදායම් ප්‍රකාශනය
4. 2024 මාර්තු 31 දිනට සුබසාධක සංගමයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

06. (අ) 2024 ජනවාරි මාසය සඳහා ACCA නිෂ්පාදකයින්ගේ ' Enrich - 1' නමැති අමුද්‍රව්‍යයට අදාලව තොග වාර්තා පහත දී ඇත. ඔවුන්ගේ සියලුම නිෂ්පාදිතයන් සිදු කරනු ලබන්නේ එක් නිෂ්පාදනාගාරයක් තුළදීය.

| දිනය | විස්තරය | ලැබීම් | | නිකුත් කිරීම් | | ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| | | ඒකක මිල රු | ප්‍රමාණය ඒකක | ඒකක මිල රු | ප්‍රමාණය ඒකක | ප්‍රමාණය ඒකක | වටිනාකම රු |
| 1.01 | ශේෂය | - | - | - | - | 300 | 9 000 |
| 1.02 | MRN001 | - | - | 30 | 100 | 200 | 6 000 |
| 1.04 | MRN008 | - | - | 30 | 30 | 170 | 5 100 |
| 1.05 | GRN001 | 40 | 1 000 | - | - | 1 170 | 45 100 |
| 1.05 | MRN011 | - | - | 30 | 170 | - | - |
| | MRN 011 | - | - | 40 | 30 | 970 | 38 800 |
| 1.1 | MRN 015 | - | - | 40 | 300 | 670 | 26 800 |
| 1.15 | RN 011 | 30 | 20 | - | - | 690 | 27 400 |
| 1.25 | MRN020 | - | - | 30 | 20 | - | - |
| | MRN020 | - | - | 40 | 470 | 200 | 8 000 |
| 1.27 | MRN025 | - | - | 40 | 100 | 100 | 4 000 |
| 1.28 | GRN012 | 40 | 1 000 | - | - | 1 100 | 44 000 |
| 1.31 | ශේෂය | - | - | - | - | 1 100 | 44 000 |

සටහන

MRN = ද්‍රව්‍ය අභියාචනා පත

GRN = ද්‍රව්‍ය හරවා එවුම් පත

RN = ද්‍රව්‍ය හරවා එවුම් පත

**අතිරේක තොරතුරු:**

i. ද්‍රව්‍ය ලැබීම සඳහා යන පොරොත්තු කාලය ඇණවුම් කල දිනයේ සිට නිශ්චිතවම දින 03 කි.

ii. ගබඩාවෙන් නිකුත් කරන ලද අමුද්‍රව්‍ය වලින් නිෂ්පාදනාගාරයේ තිබූ ‘Enrich -1’ තොග පහත අයුරු විය.

| | **ඒකක මිල (රු)** | **ප්‍රමාණය (ඒකක)** |
|---|---|---|
| ජනවාරි 01 දිනට | 30 | 50 |
| ජනවාරි 31 දිනට | 40 | 60 |

**අවශ්‍ය වන්නේ,**

1. 'RM-1 නිකුත් කිරීමේ මිල ක්‍රමය
2. RM-1" යළි ඇණවුම් ප්‍රමාණය
3. 'RM-1' හි යළි ඇණවුම් මට්ටම
4. ජනවාරි මාසය සඳහා නිෂ්පාදනාගාරය පාවිච්චි කළ ද්‍රව්‍ය වල පිරිවැය
5. 'Enrich - 1' හි ආර්ථික ඇණවුම් ප්‍රමාණය ඒකක 800 ක් වන්නේ නම් වැය වන තොග පිරිවැය, ' Enrich -1" සඳහා දැනට වැය වන තොග පිරිවැයට වඩා වැඩි වේද අඩු වේද නැතහොත් වෙනසක් නොවේ ද යන්න සඳහන් කරන්න

(ආ) ආයතනයක් වර්තමානයේ දී ඒකක 20,000 ක් විකුණනු ලබන අතර එම අවස්ථාවේ දී එයට අදාළ විස්තර පහත පරිදි වේ.

| | |
|---|---|
| ලාභය | 200 000 |
| ස්ථාවර පිරිවැය. | 300 000 |
| ලාභ පරිමා අනුපාතය | 20% |

**ඉහත තොරතුරු උපයෝගී කර කරගනිමින්,**

1. ලාභ සමච්චච්ඡේදන ලක්ෂය ගණනය කරන්න.
2. ඒකක 25,000 ක් විකුණන විට ලාභය ගණනය කරන්න.
3. ඒකකයක විකුණුම් 20% කින් වැඩි වන්නේ නම් වර්තමාන විකුණුම් මට්ටමේ දී උපයනු ලබන ලාභය කොපමණද?
4. ලාභ පරිමා අනුපාතය 40% දක්වා ඉහළ නැංවීමට නම් විචල්‍ය වැයේ සිදුකල යුතු අඩු වීම කොපමණද?

# Suggested Answers

| | | | | | |
|---|---|---|---|---|---|
| **1)** | 5 | **2)** | 3 | **3)** | 4 |
| **4)** | 2 | **5)** | 3 | **6)** | 1 |
| **7)** | 2 | **8)** | 3 | **9)** | 1 |
| **10)** | 2 | **11)** | 3 | **12)** | 2 |
| **13)** | 3 | **14)** | 2 | **15)** | 4 |
| **16)** | 3 | **17)** | 2 | **18)** | 5 |
| **19)** | 2 | **20)** | 3 | **21)** | 3 |
| **22)** | 3 | **23)** | 1 | **24)** | 4 |
| **25)** | 4 | **26)** | 4 | **27)** | 4 |
| **28)** | 4 | **29)** | 1 | **30)** | 2 |

**31)** රු. 57,000

**32)** a). රු. 990,000 b) රු. 325,000

**33)**

- නිෂ්පාදන පිරිවැය පාලනය කිරීම
- ඒකකයක නිෂ්පාදන පිරිවැය ගණනයට
- නිෂ්. පිරිවැයේ සංයුතිය අවබෝධ කර ගැනීම

**34)** රු. 85,400

**35)** රු. 275,000

**36)** රු. 700,000

**37)**

| **සාමාන්‍ය කොටස්** | **ණයකර** |
|---|---|
| • නිශ්චිත ලාභාංශයක් හිමි නොවෙයි. | • නිශ්චිත පොලියක් හිමිවේ. |
| • ව්‍යාපාරයේ බැඳීම් නිරවුල් කිරීමේ දී ප්‍රමුඛතාව හිමි නොවේ. | • ව්‍යාපාරයේ බැඳීම් නිරවුල් කිරීමේ දී ප්‍රමුඛතාව හිමි වේ. |

**38)**

| | **ප්‍රතිපාදන** | **අසම්භාව්‍ය වගකීම්** |
|---|---|---|
| 1. | නිරාකරණයේදී ආර්ථික සම්පත් පිටතට ගලා යයි. | ආර්ථික සම්පත් පිටතට ගලායාමේ නිශ්චිතතාවයක් නොමැත. |
| 2. | මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගනී. | මූල්‍ය ප්‍රකාශනවල හඳුනා නොගන්නා අතර සටහනක් තබයි. |

**39)**

(i) රු. මිලියන 40 (ii) රු. මිලියන105

**40)**

A. MyEnrich.lk සමාගම විසින් ගොඩනැගිල්ලක් ඉදිකරගැනීම සඳහා ACCA ආයතනය සමග ගිවිසුමකට එළඹුණි.

B. ගොඩනැගිල්ල ඉදිකිරීම අදියර දෙකකින් සිදු වේ.
C. සම්පූර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීමට රු. 1,000,000 වැය වේ.
D. පලමු අදියර සඳහා රු. 600,000ක් වැය වේ.
E. ආදායම හඳුනාගැනීම

**41)**

| | අයිතමය | ආදායමක් ලෙස හඳුනා ගැනීම (ඔව් / නැත) |
|---|---|---|
| A. | අත්පිට විකිණුම් | ඔව් |
| B. | ගොඩනැගිල්ලක් විකිණීමෙන් ලද මුදල | නැත |
| C. | ස්ථාවර තැන්පතුවක් මත ප්‍රවර්ථන වර්ෂය සඳහා ලැබිය යුතු පොලිය | ඔව් |
| D. | මෝටර් රථ ප්‍රථමවර ප්‍රත්‍යාගණනයෙන් ලද අතිරික්තය | ඔව් |

**42)** රු. 108,000

**43)**

(i) රු. 19,000 (ii) රු. 7,750

**44)**

(i) ඒකක 200 (ii) වාර 50

**45)**

1. ඒකක 3,800
2. ඒකක 11,400

**46)**

- ඉල්ලුම දන්නා අතර එය වර්ෂය පුරාම ඒකාකාරි වේ.
- ඇනවුම් පිරිවැය, ඇනවුම් කරනු ලබන වාර ගණන මත තීරණය වේ.

**47)** රු. 137,000

**48)**

I. වාර 3
II. දින 36

**49)**

(අ) රු. 480,000
(ආ) රු. 20
(ඉ) ඒකක 24,000

**50)**

(අ) රු. 550,000
(ආ) වර්ෂ 04

# Suggested Answers

**01.** 01.

සීමිත MyEnrich.lk පොදු සමාගමේ
2024.03.31 දිනෙන් අවසන් වර්ෂයට
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය රු. ' 000

| | | |
|---|---|---|
| විකුණුම් | | 15,520 |
| විකුණුම් පිරිවැය | | (6,700) |
| දළ ලාභය | | 8,820 |
| වෙනත් ආදායම් | | 120 |
| ආයතනික හා පරිපාලන | | 1,655 |
| විකුණුම් හා බෙදාහැරීම් | | 2,050 |
| මූල්‍ය | | 270 |
| වෙනත් පිරිවැය | | 1,620 |
| බදු පෙර ලාභය | | 3,335 |
| ආදායම් බදු | | 1,000 |
| කාලච්ඡේදය සඳහා ලාභය | | 2,335 |
| වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රත්‍යාගණන ලාභ | | 200 |
| මුළු විස්තීරණ ආදායම් | | 2,535 |

02.

සීමිත MyEnrich.lk පොදු සමාගමේ
2024.03.31 න් අවසන් දිනට
හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය රු. ' 000

| | සා. කො. | පොදු සංචිතය | ප්‍රත්‍යාගණන සංචිත | රඳවාගත් ලාභ |
|---|---|---|---|---|
| ඉ/ගෙ | 6,000 | | | 3,360 |
| වර්ෂයේ ලාභ | | | | 2,335 |
| ඉඩම් ප්‍රත්‍යාගණන | | | 200 | |
| ප්‍රසාද කොටස් නිකුතුව | 3,000 | | | 3,000 |
| පොදු සංචිතය මාරු | | 100 | | 100 |
| | 9,000 | 100 | 200 | 2,595 |

03.

සීමිත MyEnrich.lk පොදු සමාගමේ
2024.03.31 න් අවසන් දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය රු. 000

| | | | |
|---|---|---|---|
| ජංගම නොවන වත්කම් | | | |
| දේ. පි. උපකරණ | | 8,825 | |
| භාවිත අයිතිය ඇති වත්කම | | 2,400 | 11,225 |
| | | | |
| ජංගම වත්කම් | | | |
| අවසන් තොගය | | 640 | |
| ණය ගැතියෝ | | 4,190 | |
| භාණ්ඩාගාර බිල්පත් | | 600 | |
| මුදල් | | 720 | 6,150 |
| | | | 17,375 |
| ස්කන්ධය හා වගකීම් | | | |
| සා. කො. | | 9,000 | |
| පොදු සංචිතය | | 100 | |
| රඳවාගත් ලාභ | | 2,595 | |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 200 | 11,895 |
| | | | |
| ජංගම නොවන වගකීම් | | | |
| කල්බදු ණයහිමි | | 1,652 | 1,652 |
| | | | |
| ජංගම වගකීම් | | | |
| ණයහිමියෝ | | 1,640 | |
| ගෙවිය යුතු EPF | | 250 | |
| ගෙවිය යුතු ETF | | 30 | |
| ගෙවිය යුතු වැටුප් | | 200 | |
| වගකීම් සහතික වෙන් කිරීම | | 750 | |
| කල්බදු වාරික | | 458 | |
| සේවක වන්දි වෙන් කිරීම | | 500 | |
| | | | 3,828 |
| | | | 17,375 |

**සටහන්**

| | ඉඩම් | ගොඩනැගිලි | මෝටර් රථ | උපකරණ |
|---|---|---|---|---|
| ඉ/ගෙ | 4,000 | 2,500 | 3,500 | 1,500 |
| ප්‍රත්‍යාගණන | 700 | | | |
| ඉ/ගෙ | | 850 | 1,100 | 450 |
| ක්ෂය | | 125 | 700 | 150 |
| | | 975 | 1,800 | 600 |
| ශුද්ධ අගය | 4,700 | 1,525 | 1,700 | 900 |

ආදායම් බදු 1,000,000
ඌන වෙන් කිරීම 0

භාවිත අයිතිය ඇති වත්කම්
වටිනාකම 3,000,000

| | | | |
|---|---|---|---|
| 1,000,000 | ක්ෂය | (600,000) |
| | | 2,400,000 |

**02.** (අ)

01. පරිභෝජනය කළ සෘජු අමුද්‍රව්‍ය පිරිවැය = රු. 350,000

02. අවසාන තොගය (පිරිවැය) = රු. 210,000

03. සෘජු පිරිවැය = රු. 69,000

04.

| පිරිවැය | විභාජන පදනම | මුළු පිරිවැය | සැකසුම් | නිමැවුම් | ගබඩා |
|---|---|---|---|---|---|
| නිෂ්පාදන වැටුප් | ප්‍රතිපාදන | 69,000 | 34,500 | 34,500 | |
| කළමනාකරන වැටුප් | ප්‍රතිපාදන | 53,000 | 26,500 | 26,500 | |
| වක්‍ර ද්‍රව්‍ය | ප්‍රතිපාදන | 32,500 | 7,300 | 25,200 | |
| විදුලිය | භූමි ප්‍රමාණය | 90,000 | 45,000 | 27,000 | 18,000 |
| කුලී | භූමි ප්‍රමාණය | 100,000 | 50,000 | 30,000 | 20,000 |
| සේවක රක්ෂණය | සේවක සංඛ්‍යාව | 18,000 | 6,000 | 6,000 | 6,000 |
| | | | 16,000 | 28,000 | (44,000) |
| | | 362,500 | 185,300 | 177,200 | |

05.

**අන්තර්ග්‍රහණ අනුපාතය**

| | | | |
|---|---|---|---|
| නිමැවුම් අංශය | 177,200 | සැකසුම් අංශය | 185,300 |
| | 1,772 | | 1,000 |
| | 100 | | 185.3 |

06.

| | |
|---|---|
| ඒකක නිෂ්පාදන පිරිවැය | 350,000 |
| | 69,000 |
| | 419,000 |
| ඒකක ප්‍රාථමික පිරිවැය | 419,000 |

07.

| | |
|---|---|
| ඒකක ප්‍රාථමික පිරිවැය | 419 |
| සැකසුම් අංශය | 926.5 (185.3 x 5) |
| නිවැවුම් අංශය | 800 (100 x 8) |
| මුළු නිෂ්පාදන පිරිවැය (එක් බැගයක) | 2,145.50 |
| මුළු පිරිවැය | 2,145.5 x 1,000 |
| | 2,145,500 |

(ආ)

වේතන පාලන ගිණුම

| | | | |
|---|---|---|---|
| ගෙවිය යුතු සේ. අ. අ. | 10,000 | වැටුප් | 150,000 |
| සේවක ණය | 18,000 | | |
| වෘත්තීය සමිති | 2,000 | | |
| දායක මුදල් | 120,000 | | |
| | 150,000 | | 150,000 |

ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් ගිණුම

| | | | |
|---|---|---|---|
| මුදල් | 3,600 | ශේෂය ඉ/ගෙ | 3,600 |
| ශේෂය ප/ගෙ | 25,000 | සේ. අ. අ. වියදම් | 15,000 |
| | | වැටුප් පාලන ගිණුම | 10,000 |
| | 28,600 | | 28,600 |
| | | ශේෂය ඉ/ගෙ | 25,000 |

ගෙවිය යුතු සේවා නියුක්ති අරමුදල් ගිණුම

| | | | |
|---|---|---|---|
| මුදල් | 30,000 | ශේෂය ඉ/ගෙ | 30,000 |
| ශේෂය ප/ගෙ | 3,000 | සේ. අ.අ. වියදම් | 3,000 |
| | 33,000 | | 33,000 |

සේවක ණය ගිණුම

| | | | |
|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 425,000 | වැටුප් පාලන ගිණුම | 18,000 |
| | | ශේ.ප/ගෙ | 407,000 |
| | 425,000 | | 425,000 |

**03.** (අ)

01. 1. ප්‍රාග්ධනය රු. 2,500,000 මුදල් හා දේපළ වලින් යෙදවීම.

2. අත්පිට මුදලට රු. 800,000 ක් වටිනා තොගයක් මිල දී ගැනීම.

3. 400,000 වටිනා තොගයක් 200,000 ක ලාභයක් සහිතව ණයට විකිණීම.

4. 400,000 වටිනා තොගයක් ණයට මිල දී ගැනීම.

5. රු. 50,000 ක් ගැනිලි සිදු කිරීම.

6. ණයගැතියන් රු. 200,000 ක් පියවීම.

7. ණයගැතියෙකුගෙන් ලද රු. 200,000 ක චෙක්පතක් අගරු වීම.

8. රු. 600,000 ක් වටිනා තොගයක් ලාභයක් සහිතව විකිණීම.

9. රු. 200,000 ක වියදමක් මුදලින් දැරීම.

10. රු. 700,000 අමතර කොමිස් ආදායමක් ලැබීම.

11. දේපල පිරියත උපකරණ ක්ෂය වාර්තා කිරීම.

12. මුදලින් රු. 200,000 ක් ගෙවා හා ණයගැති ශේෂයක් මඟින් ණය හිමියෙකු පියවීම.

02.

| | | |
|---|---|---|
| විකුණුම් | 1,500,000 | (600,000 +900,000) |
| ගැණුම් | 1,200,000 | (800,000 + 400,000) |
| අවසන් තොගය | (200,000) | |
| දළ ලාභය | 500,000 | |

| | |
|---|---|
| කොමිස් ආදායම් | 700,000 |
| වියදම් | (50,000) |
| | (200,000) |
| ක්ෂය | (20,000) |
| බදු කුලී | (125,000) |
| සේවා ගාස්තු | (13,000) |
| ශුද්ධ ලාභය | 792,000 |

03.

සංශෝධිත මුදල් ගිණුම

| | | | |
|---|---|---|---|
| ශේෂය | 1,842,000 | සේවා ගාස්තු | 13,000 |
| ප්‍රේෂණ | 48,000 | බදු කුලී | 135,000 |
| | | ප/ගෙ | 1,742,000 |
| | 1,890,000 | | 1,890,000 |

04.

බැංකු සැසඳුම් ප්‍රකාශය

| | | |
|---|---|---|
| සංශෝධිත ශේෂය | | 1,742,000 |
| (+) නිකුත් කල චෙක්පත් | 330,000 | |
| (-) තැන්පත් කල චෙක්පත් | (1,428,000) | |
| බැංකු ප්‍රකාශය අනුව ශේෂය | | 644,000 |

(ආ)

1.

| | | |
|---|---|---|
| විකුණුම් ගිණුම හර | 90,000 | |
| අවිනිශ්චිත ගිණුම බැර | | 90,000 |
| බොල් ණය ගිණුම හර | 14,000 | |
| ණයගැති ගිණුම බැර | | 14,000 |
| කාර්යාල උපකරණ ගිණුම හර | 60,000 | |
| කාර්/උපකරණ වියදම් ගි. බැර | | 60,000 |
| ක්ෂය ගිණුම හර | 3,000 | |
| ක්ෂය වෙන් කිරීමේ ගිණුම බැර | | 3,000 |
| ලද පොළී ගිණුම හර | 10,000 | |
| බැංකු ණය පොළී ගිණුම හර | 10,000 | |
| අවිනිශ්චිත ගිණුම බැර | | 20,000 |
| විකුණුම් ගිණුම හර | 40,000 | |
| විකුණුම් අත්තිකාරම් ගිණුම බැර | | 40,000 |
| ---------------- | 3,600,000 | |
| අවිනිශ්චිත ගිණුම බැර | | 3,600,000 |
| ගැනුම් ගිණුම හර | 25,000 | |

ණයහිමි ගිණුම බැර 25,000

ණයහිමි පාලන ගිණුම හර 60,000
ලද වට්ටම් ගිණුම බැර 60,000

තොග කපා හැරීම් ගිණුම හර 35,000
අවසන් තොග ගිණුම බැර 35,000

**2.**

ලාභය නිවැරදි කිරීමේ ප්‍රකාශය

| | | |
|---|---|---|
| ගණනය කර ඇති ලාභය | | 650,000 |
| (+) එකතු කිරීම් | 60,000 | |
| | 60,000 | 120,000 |
| (-) අඩු කිරීම | | |
| | 35,000 | |
| | 90,000 | |
| | 14,000 | |
| | 3,000 | |
| | 10,000 | |
| | 40,000 | |
| | 25,000 | (217,000) |
| නිවැරදි ලාභය | | 553,000 |

**3.**

2. ආරක්ෂණ සංකල්පය
3. ගැලපුම්/උපචිත සංකල්පය
5. කාලච්ඡේද සංකල්පය / උපලබ්ධි සංකල්පය
9. ආරක්ෂණ සංකල්පය

**04.** (අ)

01.

රංග, සුරංග, විරංග හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශය (,000)

| | | |
|---|---|---|
| විකුණුම් | | 4,227 |
| විකුණුම් පිරිවැය | | (1,985) |
| දල ලාභ | | 2,242 |
| වියදම් | | |
| පරිපාලන වියදම් | 200 | |
| විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | 360 | |
| මූල්‍ය වියදම් | 75 | (635) |
| ශුද්ධ ලාභය | | 1,607 |

ලාභලාභ විසර්ජන ගිණුම

| | | | |
|---|---|---|---|
| ශුද්ධ ලාභය | | | 1,607 |
| ප්‍රාග්ධන පොලී | R | 160 | |
| | S | 120 | |
| | W | 100 | (380) |
| | | | 1,227 |

| | | | |
|---|---|---|---|
| වේතන | R | 126 | |
| | W | 126 | (252) |
| | | | 975 |
| ලාභ කොටස් | R | 487.5 | |
| | S | 292.5 | |
| | W | 195 | (975) |
| | | | 0 |

02.

ප්‍රාග්ධන ගිණුම

| | R | S | W | | R | S | W |
|---|---|---|---|---|---|---|---|
| කීර්ති නාමය | 40 | 24 | 16 | ඉ/ගෙ | 1,590 | 1,194 | |
| | | | | ප්‍රාග්ධනය | | | 1,016 |
| | | | | කීර්ති නාමය | 50 | 30 | |
| ප/ගෙ | 1,600 | 1,200 | 1,000 | | | | |
| | 1,040 | 1,224 | 1,016 | | 1,640 | 1,224 | 1,016 |

ජංගම ගිණුම

| | R | S | W | | R | S | W |
|---|---|---|---|---|---|---|---|
| වේතන | 60 | | 60 | ඉ/ගෙ | 200 | 150 | |
| ආදායම් බදු | 20 | | | ගෙ. කුලී | 40 | | |
| භාණ්ඩ ගැනිලි | | | 15 | ණය පොලී | 25 | | |
| | | | | ප්‍රාග්ධන පොලී | 160 | 120 | 100 |
| | | | | වේතන | 126 | | 126 |
| | | | | ලාභ කොටස් | 487.5 | 292.5 | 195 |
| ප/ගෙ | 933.5 | 547.5 | 336 | | | | |
| | 1013.5 | 547.5 | 411 | | 1013.5 | 547.5 | 411 |

(ආ)

01.

| | | | |
|---|---|---|---|
| ලැ/ යුතු රක්ෂණ වන්දි | හර | 960,000 | |
| වාහන හානි | හර | 240,000 | |
| මුදල් | බැර | | 1,200,000 |

02.

ආදායම් ප්‍රකාශය

| | |
|---|---|
| වෙනත් ආදායම් | |
| වත්කම් විකුණුම් ලාභ | 300,000 |
| | |
| ආයතන හා පරිපාලන විය. | (400,000) |
| විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | |

| | | |
|---|---|---|
| වාහන අළුත්වැඩියා | 240,000 | |
| වාහන ක්ෂය | 1,600,000 | (1,840,000) |

03.

දේ.පි.උප.සටහන

| | |
|---|---|
| ඉ/ගෙ | 12,500 |
| ඉවත් කිරීම් | (2,300) |
| මිලදී ගැනීම් | 2,000 |
| | 12,200 |
| ඉ/ගෙ | 3,000 |
| ක්ෂය | 2,240 |
| ඉවත් කිරීම් | (500) |
| | 4,740 |
| ශුද්ධ අගය | 7,460 |

**05.** (අ)

**සීමිත MyEnrich.lk සමාගමේ**

**2021.03.31 න් අවසන් වර්ෂයේ**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය** **රු. 000**

| | | |
|---|---|---|
| බදු පෙර ලාභය | 1,890 | |
| ගැලපිලි | | |
| රථ ඉවත් ලාභ | (550) | |
| ක්ෂය | 450 | |
| පොලී | 60 | |
| | 1,850 | |
| කාරක ප්‍රාග්ධනය | | |
| තොග වැඩිවීම | (30) | |
| ලැබිය යුතු දෑ අඩු වීම | 10 | |
| ගෙවිය යුතු දෑ වැඩි වීම | 310 | |
| | 2,140 | |
| (-) පොලී | (40) | |
| බදු | (260) | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් මත ජනනය වූ ශුද්ධ මූල්‍ය ප්‍රවාහය | | 1,840 |
| ආ/ක්‍රි | | |
| රථ විකුණුම් | 2,250 | |

| | | |
|---|---|---|
| ගොඩනැගිලි මිලට ගැනීම | (3,950) | |
| ආ/ක්‍රි/යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | (1,700) |
| මූල්‍ය ක්‍රියාකාරකම් | | |
| ණයකර නිකුතු | 100 | |
| ලාභාංශ ගෙවීම | (550) | |
| හිමිකම් නිකුතු | 500 | |
| මූ/ක්‍රි/මත ශුද්ධ මුදල් ප්‍රවාහය | | 50 |
| මුදල්, මුදල් හා සමාන දෑ ශුද්ධ වැඩිවීම | | 190 |
| (+) ආරම්භක මුදල් හා සමාන දෑ | | 300 |
| අවසාන මුදල් හා සමාන දෑ | | 490 |

(ආ)

01.

**සාමාජික මුදල් ගිණුම (රු. '000)**

| | | | |
|---|---|---|---|
| හිඟ සාමාජික මුදල් ගිණුම | 25 | කලින් ලද සාමාජික මුදල් | 15 |
| ආදායම් හා වියදම් ගිණුම | 302 | මුදල් ගිණුම | 272 |
| කලින් ලද සාමාජික මුදල් ගිණුම | 10 | ආදායම් හා වියදම් ගිණුම (කපා හැරීම) | 10 |
| | | හිඟ සාමාජික මුදල් | 40 |
| | 337 | | 337 |

හෝ

**සාමාජික මුදල් ගිණුම (රු. '000)**

| | | | |
|---|---|---|---|
| ආදායම් හා වියදම් ගිණුම | 302 | මුදල් ගිණුම | 272 |
| | | හිඟ සාමාජික මුදල් ගිණුම | 15 |
| | | ආදායම් හා වියදම් ගිණුම (කපා හැරීම) | 10 |
| | | කලින් ලද සාමාජික මුදල් | 5 |
| | 302 | | 302 |

02.

**2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**පොත් අලෙවිසැලෙහි ආදායම් ප්‍රකාශනය (රු. '000)**

| | | |
|---|---|---|
| විකුණුම් | | 300 |
| විකුණුම් පිරිවැය | | -225 |
| දළ ලාභය | | 75 |
| පොත් පරිත්‍යාග | | - |
| වියදම් | | |
| විකුණුම් සේවක වැටුප් | 15 | |
| ප්‍රවාහන වියදම් | 5 | |

| | | |
|---|---|---|
| කාර්යාල කුලී | 10 | |
| ලී බඩු ක්ෂය | 5 | |
| ලාභය | | -35 |
| | | 40 |

03.

**2022 මාර්තු 31 දිනෙන් අවසන් මාස තුන සඳහා**
**සුහ සාධන සංගමයේ ආදායම් ප්‍රකාශනය (රු. '000)**

| | | |
|---|---|---|
| ආදායම් | | 302 |
| සාමාජික මුදල් | | 40 |
| පොත් අලෙවි සැලේ ලාභය | | 6 |
| පොලී ආදායම | | 75 |
| පොත් පරිත්‍යාග | | 423 |
| වියදම් | | |
| මුදල් නැති වීම | 5 | |
| සාමාජික මුදල් කපා හැරීම | 10 | |
| කාර්යාල කුලී | 20 | |
| ලිපි ද්‍රව්‍ය | 20 | |
| උපකරණ ක්ෂය | 8 | |
| පරිපාලන වියදම් | 50 | |
| සුභ සාධන වියදම් | 174 | -287 |
| වර්ෂයේ අතිරික්තය | | 136 |

04.

**2022 මාර්තු 31 දිනට**
**සුභ සාධක සංගමයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (රු. '000)**

| | | |
|---|---|---|
| ජංගම නොවන වත්කම් | | |
| ලී බඩු | | 35 |
| උපකරණ | | 52 |
| | | 67 |
| ජංගම වත්කම් | | |
| ලිපි ද්‍රව්‍ය තොගය | 3 | |
| පොත් හා සහරා තොගය | 170 | |
| හිඟ සාමාජික මුදල් | 40 | |
| ස්ථාවර තැන්පත් | 60 | |
| මුදල් | 105 | 378 |
| මුළු වත්කම් | | 445 |
| සමුච්චිත අරමුදල 2021.04.01 | | 259 |
| වර්ෂයේ අතිරික්තය | | 136 |
| සමුච්චිත අරමුදල 2022.03.31 | | 395 |
| | | - |
| ජංගම වගකීම් | | |
| කලින් ලද සාමාජික මුදල් | 10 | |
| පොත් සැපයුම් කරුවන්ගේ ණය | 40 | 50 |
| සමුච්චිත අරමුදල හා මුළු වගකීම | | 445 |

**06.** (අ)

01. FIFO

02. ඒකක 1,000

03. ඒකක 200

04.

| | රු. |
|---|---|
| ආරම්භක තොගය | 1,500 |
| + ශුද්ධ නිකුත් කිරීම් | 45,000 (9,600+36,000-600) |
| - අවසන් තොගය | - 2,400 |
| | 44,100 |

05. මුළු තොග පිරිවැය අඩුවේ.

(ආ)

01.

ලාභ සමච්ඡේදන ලක්ෂය = $\frac{300,000}{0.2}$

(රුපියල්) = **1,500,000**

02.

ඒකක 25,000 මුළු පිරිවැය = (25,000 x 100) + 300,000

**2,800,000**

විකුණුම් වටිනාකම = 25,000 x 125

**3,125,000**

ලාභය (ඒකක 25,000) = 3,125,000 – 2,800,000

**325,000**

03.

මිල 20% කින් වැඩි වේ නම් ලාභය = (125 x 1.20) x 20,000 – (2,300,000)

**700,000**

04.

ලාභ පරිමා අනුපාතය 40% දක්වා වැඩි කිරීමට = $\frac{50}{125}$

විචල්‍ය පිරිවැය 25% කින් අඩු කල යුතුය.

= **0.4**